ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்

Sri Lanka Broadcasting Corporation



වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report
2020

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

වාර්ෂික වාර්තාව
සහ
ගිණුම් ප්‍රකාශය

2020 ජනවාරි මස **01** දින සිට දෙසැම්බර් මස **31** දක්වා

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,
පානළුව, පාදුක්ක.

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
කොළඹ.

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ලේඛන ඇතුළත් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

1. 2020 ජනවාරි මස 01 වන දින සිට 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඉටු කළ කාර්යයන් පිළිබඳ පාලන වාර්තාව.
2. 2020 ජනවාරි මස 01 දින සිට 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ ගිණුම් වර්ෂය සඳහා ගිණුම් සම්බන්ධ වාර්තාව
3. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අවසන් ගිණුම් සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව
4. 2020 විගණකාධිපති වර්තාව සඳහා සංස්ථාව ඉදිරිපත් කළ පරිකථනය

මෙයට,
විශ්වාසී,

සභාපති,
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,
කොළඹ 07.

පටුන

		පිටු අංකය
1.	පාලන වාර්තාව	01
2.	වාර්ෂික ගිණුම් ප්‍රකාශය	21
3.	මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වර්තාව	51
4.	**2020** විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය	63

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

දැක්ම

ප්‍රමුඛ ශ්‍රී ලාංකික ගුවන්විදුලි සන්නිවේදකයා වීම.

මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනකොට්ඨාශයන්හි අවශ්‍යතා පෝෂණය කිරීම, ශක්තිමත් කිරීම හා ජාතිකත්වය ගොඩනැංවීම උදෙසා ඉටුකරනු ලැබූ විශිෂ්ට කාර්යභාරය අනාගතයේදී ද ඉටුකරමින් සෑම ජනකොට්ඨාශයකගේම ආර්ථික, සමාජීය, දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික හා සදාචාරාත්මක තත්ත්වයන් උසස් මට්ටමකින් පවත්වාගනිමින් රටෙත්, පොදු මහජනතාවගෙත් සෞභාග්‍ය වෙනුවෙන් වූ රජයේ කාර්යභාරය ඉටු කිරීමට සියලු ජන කොටස්වල සන්නිවේදන අවශ්‍යතාවය හා ජීවන තත්ත්වය උසස් කරනු පිණිස දැනුම, ආකල්ප, කුසලතා පෝෂණය කරන සන්නිවේදන මෙහෙවර ක්‍රියාත්මක කිරීම.

අරමුණු

කෙටි කාලීන අරමුණු

- නිරවද්‍ය තොරතුරු වගකීමෙන් හා වගවීමෙන් යුතුව කඩිනමින් ලබාදීම හා තත්කාලීන තොරතුරුවලින් ග්‍රාහක ප්‍රජාව යාවත්කාලීන කිරීම.

- සංස්කෘතික අනන්‍යතවයන් සුරක්ෂිත කරමින්, ජාතික අභිවෘද්ධිය උදෙසා නව නිර්මාණාත්මක පැතිකඩ සොයා යමින්, උසස් රසවින්දනයක් ග්‍රාහක ප්‍රජාවට සන්නිවේදනය කිරීම සඳහා සුභාවිත ගීතය, කාලීන වැඩසටහන්, ශ්‍රාස්ත්‍රීය සාකච්ඡා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.

- සන්නිවේදනයෙහි තාක්ෂණික අවකාශය පුළුල්වීමත් සමඟ මූල්‍ය ප්‍රතිලාභ පෙරදැරි වූ ව්‍යාපාරයක් බවට සන්නිවේදන කර්මාන්තය පත්වීම හේතුවෙන් සුරක්ෂිත වියයුතු මාධ්‍ය ආචාර ධර්ම පද්ධතියකට අනුකූලව කටයුතු කිරීම මෙන්ම, මාධ්‍ය සම්ප්‍රදාය හා ආචාර ධර්ම ආරක්ෂා කරන පුරෝගාමී සන්නිවේදන ආයතනය ලෙස කටයුතු කිරීම.

- සන්නිවේදන කුසලතාවයන්ගෙන් පිරිපුන් ආයතනයක් ලෙස යහපත් මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.

- ශ්‍රී ලාංකීය ජන ප්‍රජාවන්ගේ අනන්‍යතාවයන්ට අයත් වාර්ගික, ආගමික, සංස්කෘතික යන අන්‍යතාවයන් නිවැරදිව සහ පැහැදිලිව හඳුනාගනිමින්, එකී අන්‍යතාවයන් සඳහා සමානාත්මතාවයෙන් ආමන්ත්‍රණය කරන ගුවන්විදුලි නාලිකා ජාලයක් පවත්වාගෙන යන ආයතනයක් ලෙස කටයුතු කිරීම.

<u>දිගුකාලීන අරමුණු</u>

- මහජන සේවා සන්නිවේදන කාර්යය ඉටුකිරීම සඳහා ව්‍යවස්ථාපිත කරන ලද සන්නිවේදන ආයතනය ලෙස, රාජ්‍ය ප්‍රතිපත්ති, සංවර්ධන වැඩසටහන්, රජයේ අරමුණු, ඉලක්ක හා සැලසුම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා වන නිර්මාණාත්මක සන්නිවේදන දායකත්වයක් සැපයීම.

- සේවක අභිප්‍රේරණය ප්‍රමුඛ කොටගනිමින් දැනුම, ආකල්ප සහ කුසලතාවයන්ගෙන් පිරිපුන් කාර්ය මණ්ඩලයක් පවත්වා ගනිමින්, මතු පරපුර උදෙසා සමබර පෞර්ශයකින් හෙබි සන්නිවේදන පරපුරක් බිහි කිරීම උදෙසා අති නවීන සන්නිවේදන පහසුකම්වලින් හා ප්‍රායෝගික පුහුණු ක්‍රියාකාරකම්වලින් පෝෂණය වූ අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනයක් ලෙස කටයුතු කිරීම.

- ව්‍යවස්ථාපිත හා ආයතනික අරමුණුවලට අනුකූලව ජාතික සන්නිවේදන අභිලාශයන් තහවුරු කරමින්, තරඟකාරී වාණිජ සන්නිවේදන වෙළඳපොල උපායමාර්ගිකව ජය ගැනීමට කටයුතු කිරීම.

- විකාශන පද්ධතිය අතිනවීන තාක්ෂණය නිසි පරිදි උපයෝගී කරගෙන සමකාලීන සමාජ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, යාවත්කාලීන කරමින්, දේශීය මෙන්ම විදේශීය ශ්‍රාවක ප්‍රජාවට පැහැදිලි හා නිරවුල් ශ්‍රවණ තත්ත්වයක් ලබාදීමට කටයුතු කිරීම.

- මූලික අවශ්‍යතාවයන්ගෙන් ස්වයංපෝෂිත වූ සෞභාග්‍යවත් ජනතාවක් ජීවත්වන රටක් ලෙස, ශ්‍රී ලාංකීය අභිමානය ඉහළට ඔසවා තැබීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම සන්නිවේදකයා වීම.

පාලන වාර්තාව - 2020

පාලන වාර්තාව - 2020

හැඳින්වීම

විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ පුරෝගාමී මාධ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, දෙපාර්තමේන්තුවක් ලෙස 1925 දෙසැම්බර් මස 16 ආරම්භ කර අනතුරුව 1966 අංක 37 දරන පාර්ලිමේන්තු පනත යටතේ 1967 ජනවාරි මස 05 වන දින සංස්ථාවක් ලෙස ස්ථාපිත කර ඇත.

2020 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා වූ මාස 12ක කාලපරිච්ඡේදය මෙම වාර්තාවෙන් ආවරණය වේ.

සමාලෝචනයට ලක්වන කාලපරිච්ඡේදය තුළ ආයතනයේ කළමනාකාරීත්වය

1. චූලානන්ද පෙරේරා මහතා	වැඩ බලන සභාපති, ලේකම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය	2020.01.13 සිට
2. රෝහණදේව පෙරේරා මහතා	සභාපති / සංස්ථා මණ්ඩල සාමාජික	2020.01.29 සිට
3. සංජීවනී වීරසිංහ මිය	සංස්ථා මණ්ඩල සාමාජික	2020.01.29 සිට
4. ගාමිණී විජේවර්ධන මහතා	සංස්ථා මණ්ඩල සාමාජික	2020.01.29 සිට
5. සිසිර මුණසිංහ මහතා	සංස්ථා මණ්ඩල සාමාජික	2020.01.29 සිට
6. ජගත් වික්‍රමසිංහ මහතා	සභාපති / සංස්ථා මණ්ඩල සාමාජික	2020.02.09 සිට
7. එම්.ජී.එස්.ආර්. සෝමසිරි මහතා	සංස්ථා මණ්ඩල සාමාජික	2020.10.05 සිට
8. එන්.එස්.පී. වාහලතන්ත්‍රී මහතා	සංස්ථා මණ්ඩල සාමාජික	2020.11.26 සිට

- 2020.01.16 දින සිට ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් චන්ද්‍රපාල ලියනගේ මහතා කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

ශ්‍රී ලාංකීක මාධ්‍ය ක්ෂේත්‍රයේ වසර 96 ක කාලයක් ඉටුකළ මාධ්‍ය මෙහෙවර තුලින් අප සමාජයේ ජන මනස පෝෂණය කර එය යහපත් ලෙස ගොඩනැඟීම සඳහා ශ්‍රී ලාංකීය ගුවන්විදුලිය අමිල මෙහෙවරක් එදාමෙදා තුර ඉටුකර ඇත. එය 1924 වර්ෂයේ ආරම්භ කර, 1925 දෙසැම්බර් 16 නිල වශයෙන් ගුවන්විදුලි ආයතනයක් ලෙස ස්ථාපනය කරන ලදී. එංගලන්තය මුල්කරගත් යුරෝපා ගුවන්විදුලිය ආරම්භයෙන් වසර 03ක් වැනි කෙටි කාලයක් ඇතුළත පෙරදිග ආරම්භ කළ ප්‍රථම ගුවන්විදුලිය වන්නේ ජාතික ගුවන්විදුලියයි.

1948-10-05 වන දින රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙසද 1950-09-30 දින සිංහල වෙළඳ සේවය ද 1951-04-01 දින දෙමළ වෙළඳ සේවය ද 1951-03-30 දින සමස්ථ ආසියා හින්දි සේවය ද 1959-08-15 දින මුස්ලිම් සේවය ද 1963-04-04 දින සන්ධ්‍යා සේවය ද ආරම්භ කරමින් ආසියාවේ රිදි සීනුව ලෙස කටයුතු කරන ලදී. 1966 අංක 37 දරණ පාර්ලිමේන්තු පනත මගින් 1967-01-05 දින සිට රාජ්‍ය සංස්ථාවක් වශයෙන් ක්‍රියාත්මක වූ අතර 1972.05.22 දින සිට “ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව“ ලෙස හැඳින්වීම ආරම්භ කරන ලදී.

රටක ප්‍රාදේශීය අනන්‍යතාවයක් හඳුනාගනිමින් එයට ගෞරවයක් ලබාදෙමින් ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා සංකල්පය අනුව කටයුතු කරමින්, මුල්ම ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාව ලෙස 1979-04-12 වන දින රජරට සේවය ද, දෙවන ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාව ලෙස 1980-02-03 වන දින රුහුණු සේවය ද, 1983-04-13 වන දින තෙවන ප්‍රාදේශීය සේවාව ලෙස මහනුවර සේවය ද ආරම්භ කර වර්තමානය වන විට ප්‍රාදේශීය සේවා 07 ක් සහ ජාතික මට්ටමේ සේවා 07 ක් සහිත පළල් සන්නිවේදන ජාලයක් ලෙස සිය අභිප්‍රායන් විශිෂ්ට ලෙස සාධනය කර ඇත.

කෙටි හා මධ්‍යම තරංග තාක්ෂණයෙන් ඔබ්බට යමින් එවකට ලොව පුරා ක්‍රියාත්මක වූ රේඩියෝ තාක්ෂණයේ නව ප්‍රවණතාවයක් වූ එෆ්.එම් තාක්ෂණය ඔස්සේ ශ්‍රී ලාංකීය මුල්ම ගුවන්විදුලි නාලිකාව ලෙස සිටි එෆ් එම් සේවය 1989.12.12 වන දින ආරම්භ කෙරිණි.

2020 වර්ෂය ලෝක ජන සමාජය තුළ ඇතිවූ අති බිහිසුණුකාරී තත්ත්වයන් ශ්‍රී ලංකාවට ද, ඒ අයුරින්ම බලපෑ අතර සමස්ත ශ්‍රී ලාංකීක සමාජය කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම හමුවේ අඩපණ විය. එසේ අඩපණ වූ ජන සමාජය යාවත්කාලීන කරමින් සිය සන්නිවේදන අවශ්‍යතා සපුරාලමින් පළල් මහජන සේවයක් ඉටුකරමින්, අභිදුෂ්කර කාලයක් පසුකරමින් එකඳු නාලිකාවක්වත් අතරමඟ නතර නොකරමින් සිය සේවාව පවත්වාගෙන යන ලදී.

සිංහල ස්වදේශීය සේවය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ආරම්භක සිංහල ගුවන්විදුලි නාලිකා අතුරින් සිංහල ස්වදේශීය සේවය ජාතික වගකීමෙන් යුතුව විශ්වසනීය හා ගුණාත්මක තොරතුරු ශ්‍රාවකයා වෙත ලබාදෙමින්, යහපත් සමාජයකට අවශ්‍ය තොරතුරු, දැනුම, පරිකල්පනය හා උසස් රසවින්දනයක් ලබාදෙමින් 2020 වර්ෂය තුළ ද සිය සුපුරුදු වගකීම මැනවින් ඉටුකර ඇත.

සමාජ ප්‍රශ්න, ගැටළු අවශ්‍යතාවයන් පිළිබඳව වගකිව යුතු පාර්ශවවල අවධානය යොමු කිරීම හා පොදුජන මතයට වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව 2020 වර්ෂයේදී මාසික වැඩසටහන් මාලාවක් සත්‍යෝක්ෂණය වැඩසටහන තුලින් සමාජගත කර ඇත.

72 වන නිදහස් සමරුව අභිමානවත් ලෙස සැමරීමට ජාතික ගුවන්විදුලියේ ස්වදේශීය සේවය සිය අභිමානවත් දායකත්වය 2020 වර්ෂයේදී ද ලබා දුන් අතර සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද හා බැඳුණු චාරිත්‍ර වාරිත්‍ර අනාගත පරම්පරාවට උරුම කිරීමේ අරමුණින්, "රටවටා අවරුදු" වැඩසටහන සහ නත්තල හා බැඳුණු සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව අනාගත පරම්පරාව දැනුවත් කිරීම හා ආගමික සහජීවනය පවත්වාගැනීම වෙනුවෙන් "රටවටා නත්තල්" වැඩසටහන් කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් පෙර වර්ෂයන්හි මෙන් ප්‍රාදේශීය සේවා ඒකාබද්ධ කරමින් විචිත්‍රාංග වැඩසටහන් පටිගත කළ වැඩසටහන් වශයෙන් ඉදිරිපත් කෙරිණි.

කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ජාතික ගුවන්විදුලියේ කාර්ය මණ්ඩලයද වසංගතයට ගොදුරු වූවත්, සියලුම විශේෂිත දින, ආගමික හා සංස්කෘතික උත්සව සහ පෙර වර්ෂයන්හි පවත්වාගෙන එන ලද සියලුම වැඩසටහන් හැකි උපරිම ආකාරයෙන් ගුණාත්මකව පවත්වාගෙන යාමට 2020 වර්ෂයේදී සිංහල ස්වදේශීය සේවය සමත් විය. FM 91.7/91.9 සංඛ්‍යාත ඔස්සේ විසුරුවා හැරෙන ශ්‍රී කා ගුවන්විදුලි සංස්ථාවේ සිංහල ස්වදේශීය සේවය, දිනපතා අළුයම 4.30ට ආරම්භ වී රාත්‍රී 10.15ට විකාශය අවසන් කරනු ලබයි.

කොරෝනා වසංගත තත්ත්වය හමුවේ අඩපණ වූ පාසැල් අධ්‍යාපනය නංවාලීමට අත්වැලක් සැපයීම අරමුණු කරගනිමින් "රේඩියෝ ගුරුවරයා 5 වසර ශිෂ්‍යත්ව අත්වැල" සහ "රේඩියෝ ගුරුවරයා විභාග අත්වැල" සතියේ දින 05 තුළ ක්‍රියාත්මක කරමින් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් මහඟු සේවාවක් ඉටුකරනු ලැබීය.

සිංහල වෙළඳ සේවය

වාණිජ සන්නිවේදනයේ ප්‍රමුඛයා ලෙස ගුවන්විදුලි සංස්ථාවේ සිංහල වෙළඳ සේවය 1950.09.30 දින සිට වෙළඳපොළ අරමුණු ජය ගනිමින් වැඩසටහන් ඉදිරිපත් කිරීමෙන් ද ශ්‍රාවක උත්තම

රසජනනය සඳහා වන නිර්මාණාත්මක වැඩසටහන් හා ජනප්‍රිය සුභාවිත ගීත ප්‍රචාරය කරමින් පොදු ශ්‍රාවක විශ්වාසයක්, ගෞරවයක්, ආදරයක් අඛණ්ඩව දිනාගනිමින් ක්‍රියාත්මක නාලිකාවයි.

මහජනතාවට වඩාත් සමීපතම නාලිකාවක් වන වෙළඳ සේවය එදිනෙදා සමාජයේ කාලීන හා ප්‍රවෘත්තිමය වටිනාකමින් යුතු සිදුවීම් පිළිබඳ දැනුවත් කෙරෙමින් ඉදිරිපත් කෙරෙන "සාරප්‍රභාගිර" වැඩසටහන මහජන සන්නිවේදන ක්‍රියාවලිය මැනවින් ඉටු කිරීමට සමත්ව ඇත.

මෙරට සම්භාවනීය ගුරු පරපුර වෙනුවෙන් ලාංකේය මාධ්‍ය ඉතිහාසයේ ප්‍රථම වරට ප්‍රමිතියෙන් උසස් ගායනාභිෂේකයක් ලෙස "ගුරු තරුව" ගායන තරගය (රියලටි ප්‍රසංගය) ආරම්භ කිරීමට සමත්වීම නාලිකාවක් ලෙස විශිෂ්ට ජයග්‍රහණයකි. වෙළඳ සේවයේ ජනප්‍රියතම වැඩසටහනක් වන මධුරසාංග වැඩසටහනට නව ප්‍රසාංගික ආකෘතියක් එක් කරමින් "Madurasanga Live in Concert" ප්‍රසංගයත් "සිටී ට 100" ප්‍රසංගයත් "ජෝතිමත් ගී" මෙන්ම "නොමියෙන මිනිසුන්" වැනි ආකර්ශනීය ප්‍රාසාංගික සංගීත වැඩසටහන් බොහෝමයක් සංවිධානය කිරීමෙන් ශ්‍රාවක ප්‍රසාදය දිනා ගැනීමට සමත් විය. මෙලෙස ජනතා සම්මානය පමණක් නොව ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙලේ ද ඇගයීමට ලක්වීම විශේෂ කොට සැලකිය හැකියි.

විශිෂ්ට ගුවන්විදුලි නිවේදිකාව ලෙස රම්‍යා ශ්‍රියාණි පතිරණ මහත්මියත්, හොඳම ගුවන්විදුලි මැදිරි නිවේදක ලෙසත්, සම්පත් සල්පිටිකෝරාළ මහතාත් විශිෂ්ටතම ගුවන්විදුලි කථික ලෙස ප්‍රවීණ නිවේදක වසන්ත රෝහණ මහතාත්, 2020 ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙලේදී සම්මානයට පාත්‍ර වූ අතර සාරප්‍රභාගිර වැඩසටහන 2020 වසරේ විශිෂ්ටතම ගුවන්විදුලි සාකච්ඡාමය වැඩසටහන වශයෙන් සම්මානයට පාත්‍ර විය.

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ සිංහල පාඨක සමාජය මැද මාවතේ ආකර්ශනයට ලක්කරමින් පවත්වාගෙන යනු ලබන ප්‍රශස්ත ගුවන්විදුලි නාලිකාවක් ලෙස සිංහල වෙළඳ සේවය ජනාදරයට පත්ව ඇත.

<u>දෙමළ ස්වදේශීය සේවය</u>

1951.04.01 දින ආරම්භ කර ඇති දෙමළ ස්වදේශීය සේවය, ජාතික ආයතනයක් ලෙස බහුවාර්ගික, බහුආගමික ජන සමාජයක භාෂාමය හා සංස්කෘතික අනන්‍යතාවයන් රැකගනිමින් සමාජයීය, ආර්ථික, දේශපාලනික, අධ්‍යාපනික හා රසවින්දනාත්මක වැඩසටහන් රාශියක් 2020 වර්ෂයේදී ප්‍රචාරය කර ඇති අතර දෙමළ ස්වදේශීය සේවා ගුවන් කාලය තුළ මුස්ලිම් සේවය සහ අධ්‍යාපන සේවය ද ක්‍රියාත්මක වී ඇත.

දෙමළ ස්වදේශීය සේවයේ විශේෂ වැඩසටහන් ලෙස රටවටා අවුරුදු වැඩසටහන, පොසොන් උත්සවයට අදාල වැඩසටහන්, විඩියුම් වේලෙයි වැඩසටහන, මත්ද්‍රව්‍ය නිවාරණ දින වැඩසටහන, මඩු වන්දනා වැඩසටහන, සරස්වතී පූජා, හජ්ජි උත්සවය, නත්තල් උත්සවය ආදීය 2020 වර්ෂයේදී විශේෂ වැඩසටහන් ලෙස ප්‍රචාරය කර ඇත.72 වන නිදහස් දින සමරුව, මහා ශිව රාත්‍රී නිමිත්තෙන් මධ්‍යම රාත්‍රී සජීවී වැඩසටහන, තෛපොංගල් උත්සවය දෙමළ ස්වදේශීය සේවය ඔස්සේ සජීවීව ප්‍රචාරය කර ඇති සුවිශේෂී වැඩසටහන් අතර වේ.

දමිල සමාජය ඉලක්ක කරගත් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්කමක් ඇති විශේෂිත දිනවලට අදාලව විශේෂ වැඩසටහන් දෙමළ ස්වදේශීය සේවය ඔස්සේ 2020 වර්ෂයේදී දී ප්‍රචාරය කර ඇති අතර කාන්තා දිනය, මැයි දිනය, වැඩිහිටි දිනය, ලෝක ළමා දිනය සහ ලෝක ඒඩ්ස් දිනය ඒ අතර ප්‍රධාන වශයෙන් සලකා කටයුතු කර ඇත.

කොරෝනා වසංගත තත්ත්වය හමුවේ පෙර වර්ෂයන්හි පවත්වාගෙන ආ සියලුම වැඩසටහන් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට නොහැකි වුවත් අඩපණව පැවති පාසල් අධ්‍යාපනය පවත්වාගෙන යාමට හා දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීමට දෙමළ ස්වදේශීය සේවය අධ්‍යාපන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබීය.

FM 102.1/102.3 සංඛ්‍යාත ඔස්සේ විසුරුවා හැරෙන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දෙමළ ස්වදේශීය සේවය, දිනපතා අළුයම 4.20ට ආරම්භ වී සතියේ දින 04ක් රාත්‍රී 10.00ට විකාශය අවසන් කරන අතර බ්‍රහස්පතින්දා, සිකුරාදා සහ සෙනසුරාදා දින රාත්‍රී 10.30ට විකාශය අවසන් කරයි.

ඉංග්‍රීසි සේවය

ශ්‍රී ලංකාව තුළ ගුවන්විදුලිය ආරම්භවීමත් සමඟම විකාශන කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් ආරම්භ වූ අතර ජාතික නාලිකා ආරම්භ කිරීම සඳහා සැලසුම් සකස් කිරීම හා එහි පළමු පියවර ලෙස 1950 සැප්තැම්බර් 30 වන දින සිට ඉංග්‍රීසි වෙළඳ සේවය ආරම්භ විය. අනතුරුව ඉතා කෙටි කලක් තුළ සිංහල හා අනෙකුත් භාෂාවලින් ද ජාතික නාලිකා ආරම්භ විය.2009 වසරේ සිට රේඩියෝ ශ්‍රී ලංකා නමින් ඉංග්‍රීසි සේවය ක්‍රියාත්මක විය.

රේඩියෝ නාලිකාවක් ලෙස වර්තමානයේද කටයුතු කරන රේඩියෝ ශ්‍රී ලංකා නාලිකාව 2020 වර්ෂය තුළ ද, ආගමික, සංස්කෘතික, සමාජයීය, ආර්ථික, රසවින්දනාත්මක හා කාලීන වැදගත්කමින් යුත් වැඩසටහන් රාශියක් නිර්මාණය කර විකාශන කරනු ලබයි. Good morning Sri Lanka, Views on Health වැඩසහටන් කාලීන තොරතුරු හා සෞඛ්‍ය ගැටළු පිළිබඳව

ජනතාව දැනුවත් කිරීම සඳහා උපයෝගී කරගෙන ඇති අතර Altima Music, Concert Hall, Country Songs වැනි වැඩසටහන්, ශ්‍රාවකයාගේ රසවින්දනය වැඩිදියුණු කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන් වේ.

පාසල් 10ක දරුවන් 200ක් පමණ සහභාගී කරවාගෙන ලෝක ළමා දින වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති අතර කොරෝනා වසංගත සමයේ The Radio Teacher වැඩසටහන තුළින් අඩපණ වී තිබූ පාසල් අධ්‍යාපනය සඳහා දායකත්වයක් සපයා ඇත.

රේඩියෝ ශ්‍රී ලංකා නාලිකාව ඔස්සේ ප්‍රචාරය වූ කාලීන වැදගත්කමක් සහිත සියලුම වැඩසටහන් සංරක්ෂණය කර ඇති අතර එම වැඩසටහන් රේඩියෝ ශ්‍රී ලංකා යූ ටියුබ් නාලිකාව ඔස්සේ ශ්‍රවණය කිරීමට ද අවස්ථාව සලසා දී ඇත.

FM 97.4 / 97.6 සංඛ්‍යාත ඔස්සේ විසුරුවා හැරෙන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ඉංග්‍රීසි සේවය, දිනපතා අළුයම 5.00ට ආරම්භ වී රාත්‍රී 10.00ට විකාශය අවසන් කරයි.

අධ්‍යාපන සේවය

2020 වර්ෂයේදී කොරෝනා වසංගතය හේතුවෙන් රට වසා දැමීම නිසා පාසල් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම අඩපණ වූ අවස්ථාවක ජාතික ගුවන්විදුලියේ අධ්‍යාපන සේවය වැඩසටහන් රාශියක් දැයේ දුවාදරුවන්ට දායාද කර ඇත. ඒ අතර සිටි. එෆ්. එම්. නාලිකාව මඟින් අ.පොෂ.(උසස් පෙළ) විෂය නිර්දේශය අදාල වූ විෂයයන් සඳහා වට්ස්අප් සහ ටෙලිග්‍රෑම් සමාජ මාධ්‍ය ජාල ඔස්සේ, දක්ෂ ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක් සහභාගී කරවා ගනිමින් විෂය කරුණු ඉගැන්වීම සිදු කර ඇත.

සිංහල ස්වදේශීය සේවය ඔස්සේ රේඩියෝ ගුරුවරයා වැඩසටහන් මාලාව ඔස්සේ 5 වසර ශිෂ්‍යත්ව විභාග අත්වැල හා සාමාන්‍ය පෙළ විභාග අත්වැල වැඩසටහන් ප්‍රචාරය කර ඇත. ඊට අමතරව අධ්‍යාපන සේවයේ මැදිහත් වීමෙන් දෙමළ ස්වදේශීය සේවයේ අධ්‍යාපන වැඩසටහන් විශාල ප්‍රමාණයක් ප්‍රචාරය කර ඇත.

සිටි. එෆ්. එම්. සේවය

1989.11.03 ආරම්භ කර ඇති සිටි එෆ් එම් සේවය, ජාතික වගකීමෙන් යුතුව විශ්ව දැනුම හා තොරතුරු නිවැරදිව විශ්වසනීයව ශ්‍රාවකයා වෙත යොමු කරමින් උසස් රුචිකත්වයක් සහිත ශ්‍රාවක ප්‍රජාවක් බිහිකිරීම සඳහා යහපත් රසවින්දනයක් ලබා දෙමින්, තරගකාරී සමාජ රාමුව තුළ

අභියෝග ජයගනිමින් ගුවන්විදුලි ක්ෂේත්‍රයේ ඵලදායී සහ ජනප්‍රිය ගුවන්විදුලි නාලිකාවක් බවට පත්වීමේ අරමුණ සාධය කර ගැනීම සඳහා 2020 වර්ෂය තුළ වැඩසටහන් ඉදිරිපත් කර ඇත.

72 වන නිදහස් සැමරුම් උළෙල සජීවීවී ප්‍රචාරය කිරීම, සෞභාග්‍යමත් රටක් ගොඩනැගීම සඳහා තාක්ෂණික දියුණුව අත්‍යවශ්‍ය සාධකයක් බව තේමාකොට ගෙන, 2020 මාර්තු 11 සිට 14 දක්වා හෝමාගම, පිටිපන NSBM පරිශ්‍රයේ පැවති Inno tech ප්‍රදර්ශන භූමියේ විශේෂ ගුවන්විදුලි මැදිරියක් ස්ථාපිත කොට සජීවීව සිටි එෆ්.එම් සේවයේ වැඩසටහන් ප්‍රචාරය කිරීම හා වරින් වර තත්ත්ව විස්තර වාර්තා ගෙන ඒම සිදුකර ඇත.

කොරෝනා වසංගත සමය තුළ සිටි එෆ්.එම් නාලිකාව ඔස්සේ උසස් පෙළ විෂය නිර්දේශයට අදාල වූ විෂයයන් සඳහා දක්ෂ ආචාර්ය මණ්ඩලයක් වට්ස්අප් සහ ටෙලිග්‍රෑම් සමාජ මාධ්‍ය භාවිතයෙන් සහභාගී කරවා ගනිමින් විෂය කරුණු ඉගැන්වීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක වූ අතර එය ඉතාමත් ජනප්‍රිය අධ්‍යාපනික වැඩසටහන් මාලාවක් බවට පත්විය. සිටි.එෆ්.එම් නාලිකාව වටා තරුණ ශ්‍රාවක ප්‍රජාව වැඩි වශයෙන් එක්වීමට එම වැඩසටහන් මාලාව විශේෂ හේතුවක් විය.

2020 සිංහල දෙමළ අලුත් අවුරුද්ද සඳහා සම්බන්ධතා මැදිරියේ සිට ඉතා විචිත්‍රවත් අයුරින් රේඩියෝ බක්මහ උළෙල පැවැත්වූ අතර විවිධ තරඟ ඉසව් සඳහා ගුවනින් තරඟකරුවන් සහභාගී කරගනිමින් එම වැඩසටහන අති විශාල ශ්‍රාවක ප්‍රතිචාර ලබමින් ප්‍රචාරය විය.

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වෙසක් උත්සවය සඳහා බාහිර ප්‍රචාරක වැඩටසහන් ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව මග හැරුණු අතර නවීන තාක්ෂණය ඔස්සේ අටසිල්, ධර්මදේශනා, ධර්ම සාකච්ඡා ආදී සියලු ආගමික වැඩසටහන් ප්‍රචාරය කෙරිණි. දිවයින පුරා විසිරී සිටින භක්ති ගීත කණ්ඩායම් සහභාගී කරවාගෙන භක්ති ගීත ප්‍රසංගයක් වට්ස්අප් සමාජ මාධ්‍ය ජාලය ඔස්සේ වෙසක් පොහෝ දින ප්‍රචාරය කෙරිණි.

සිටි.එෆ්.එම් සේවය සෑම පෝය දිනකම දවස පුරා පෝදින වැඩසටහන් ප්‍රචාරය කළ අතර “පෝදා වරුණ“ විචිත්‍රාංගමය වැඩසටහන අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී ශ්‍රී මහා බෝධිය සහ මහියංගන රාජමහා විහාරය පිළිබඳව විස්තර සහිතව ප්‍රචාරය කරන ලදී.

මහාචාර්ය කෝලිත හානු දිසානායක මහතා විසින් මෙහෙවනු ලැබූ Melody of Rhythm වැඩසටහන සංගීතමය විචාරාත්මක වැඩසටහනක් වූ අතර එය 2020 අගෝස්තු මාසයේ සිට සෑම සතියකම පටිගත කෙරිනි.

ජාතික තරුණ සේවා සභාවෙන් බිහිවූ විශාරද සෝමසිරි මැදගෙදර ගායන ශිල්පියා වෙත ගුවන්විදුලි උපහාර පුදමින් විශේෂ සංගීත ප්‍රසංගයක් සිටි එෆ්.එම් සේවය මඟින් 2020 වසරේදී සංවිධානය කර ඇත.

ලෝක ළමා දිනය නිමිත්තෙන් නිදහස් චතුරශ්‍ර පරිශ්‍රයේ පැවති "සුරදරු" ගී ප්‍රසංගය වරින් වර සජීවීව ප්‍රචාරය කළ අතර ලංකා විදුලිබල මණ්ඩලයට වසර 51ක් පිරීම නිමිත්තෙන් 2021.11.01 දින දවස පුරා ශ්‍රාවකයාට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර මුදල් ත්‍යාග පිරිනැමීම ද සිදුකර ඇත. එදින පිරිනැමූ ත්‍යාග මුදල්වල වටිනාකම රුපියල් දෙලක්ෂ පනස් පන්දහසකි. එදින රාත්‍රියේදී ජාතික රූපවාහිනිය සමඟ ඒකාබද්ධව සංගීත ප්‍රසංගයක් පැවැත්වූ අතර එම ප්‍රසංගය සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ අති විශාල ප්‍රතිචාර හිමිකර ගනු ලැබිණි.

කොරෝනා වසංගතය හමුවේ වුවද නත්තල නිමිත්තකොටගෙන ප්‍රවීණ ගායිකා මරියසෙල් ගුණතිලක මහත්මියගේද සහභාගීත්වයෙන් නත්තල් ගී ප්‍රසංගයක් පැවැත්වූ අතර වට්ස්ඇප් හරහා තෝරාගන්නා ලද නත්තල් බැති ගී කණ්ඩායම් 03ක් ද ඒ සඳහා සහභාගී විය.

2020 වර්ෂයේ සිටි එෆ්.එම් නාලිකාවේ අරමුණු හා පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා විවිධ අංශ ඔස්සේ විශාල වැඩසටහන් ප්‍රමාණයක් සංවිධානය කර, ඉතා සාර්ථකව ප්‍රචාරය කර ඇත. ඊට අමතරව පෙර වර්ෂයන්හි සිට පවත්වාගෙන එන දෛනික වැඩසටහන් ඔස්සේ ද සිටි එෆ්.එම් නාලිකාව සිය අනන්‍යතාවය රැකගනිමින් සාර්ථකව 2020 වර්ෂයේ කටයුතු කර ඇත.

FM 89.6 / 89.8 සංඛ්‍යාත ඔස්සේ විසුරුවා හැරෙන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සිටි එෆ්.එම් සේවය, 2020 වර්ෂයේ දී 24 පැය පුරා විකාශන කටයුතු ඉටු කර කරයි.

<u>තෙන්ඩ්‍රල් සේවය</u>

2001.04.17 ආරම්භ කර ඇති තෙන්ඩ්‍රල් එෆ්. එම්. සේවය, අසන්නන්ගේ විවිධ වූ රසවින්දන අවශ්‍යතා වෙනුවෙන් 2020 වර්ෂය තුළ ද විවිධ වැඩසටහන් විකාශය කර ඇත. තෙන්ඩ්‍රල් සේවය විශේෂයෙන්ම ක්‍රියාත්මක වන්නේ තරුණ ප්‍රජාව ඉලක්ක ගනිමිනි. විවිධ වූ සමාජ ස්ථරයන් නියෝජනය කෙරෙන දෙමළ සමාජයේ රසිකත්වය සන්තෘප්ත කිරීමේ අරමුණින් 2020 වර්ෂය තුළ රසවින්දනාත්මක වැඩසටහන් රාශියක් ප්‍රචාරය කර ඇති අතර දෙමළ ස්වදේශීය සේවය හා සමගාමීව ජාතික, දේශපාලනික, ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත් අවස්ථා සඳහා ද විවිධ වැඩසටහන් ප්‍රචාරය කර ඇත.

2020 වසරේ ප්‍රචාරය කරන ලද විශේෂ වැඩසටහන් වශයෙන් විදියුම් වේලෙයි, තෙපොංගල් සජීවී වැඩසටහන, නිදහස් දින සැමරුම, සරස්වතී පූජාව, රටවටා අවුරුදු වැඩසටහන්, හජ්ජී උත්සවය, උරවල් ඉල්ලම්, කොරෝනා සමයේ ප්‍රචාරය වූ අරින්තතුම් අරියතතුම්, උන්මයින් කුරල්, මක්කල් කරුතු වැඩසටහන්, මෙන්ම ජාත්‍යන්තර කාන්තා දිනය, ලෝක කම්කරු දිනය, ජාත්‍යන්තර වැඩිහිටි දිනය, ලෝක ළමා දිනය, ඒඩ්ස් දිනය ආදී විශේෂිත දින සම්බන්ධ වැඩසටහන් ද ආගමික වැඩසටහන්, නාට්‍ය හඳුන්වා දිය හැක.

FM 107.7/104.9 සංඛ්‍යාත ඔස්සේ විසුරුවා හැරෙන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ තෙන්ඩ්‍රල් සේවය, දිනපතා අළුයම 5.00ට ආරම්භ වී රාත්‍රී 11.30ට විකාශන කටයුතු අවසන් කරයි.

මුස්ලිම් සේවය

FM 102.1 හා 102.3 දෙමළ ස්වදේශීය සේවා තරංගමාලා ඔස්සේ විකාශය වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මුස්ලිම් සේවය, ශ්‍රී ලාංකික මුස්ලිම් ජන සමාජය තුළ හා දකුණු ඉන්දියාව තුළ වසර 65කට වැඩි කාලයක් ජනප්‍රියව පවතින අතර මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් විකාශය වන එකම ජාතික ගුවන්විදුලි නාලිකාව වේ. පැය 0545-0550, 0800-1030, 2000-2100 මුස්ලිම් සේවා ගුවන් කාලය වන අතර, අනුග්‍රාහක දායකත්වය ලැබෙනම් ඊට අදාළව ගුවන් කාලයන් යොදවා මුස්ලිම් සේවා වැඩටසහන් විකාශය වේ. ආගමික වැඩසටහන්, ළමා වැඩසටහන්, සංගීතමය හා නාට්‍යමය වැඩසටහන්, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, තරුණ සහරාමය වැඩසටහන්, ජාතික වශයෙන් වැදගත් වැඩසටහන්, ශ්‍රී ලාංකික මැලේ ජනතාව වෙනුවෙන් නිර්මාණය කර ඇති මැලේ මැගසීන්, උර්දු භාෂාව කතා කිරීම සම්බන්ධ වැඩසටහන් 2020 වර්ෂයේ විකාශය කර ඇත. රාමසාන් කාලය තුළ, ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාව සමඟ ඒකාත්මික වෙමින් වැඩසටහන් ප්‍රචාරය කිරීම මුස්ලිම් සේවය ඔස්සේ සිදුවන අතර සම්පූර්ණයෙන්ම මෙම මාසයේ වැඩසටහන් සඳහා සේවාදායක අනුග්‍රහය හිමිවේ.

මුස්ලිම් සේවයේ මැදිහත් වීමෙන් සිංහල ස්වදේශීය සේවය ඔස්සේ ඉස්ලාම් ආගමික වැඩසටහනක් සිංහල භාෂාවෙන් ප්‍රචාරය වේ.

2020 වර්ෂයේ මුස්ලිම් සේවා වාර්ෂික ආදායම, රුපියල් 33,107,045.13ක් වේ.

ප්‍රාදේශීය සේවා

රජරට සේවය

107.3 FM තරංගමාලා ඔස්සේ රජරට ප්‍රදේශය මූලික කරගනිමින් දිස්ත්‍රික්ක 13 පුරා කරගහතැන්න විකාශනාගාරය ඔස්සේ විසුරුවා හැරෙන රජරට සේවය, 1979.04.12 සිට මේ දක්වා සිය අරමුණු සාර්ථක කර ගැනීමට කටයුතු කර ඇත. 2020 වර්ෂය තුළ රජරට සේවය සිය ප්‍රාදේශීය සහ ජාතික වශයෙන් තමන් වෙත පැවරී ඇති වගකීම මැනවින් හඳුනාගෙන වැඩසටහන් නිෂ්පාදනය කොට ප්‍රචාරයට යොදා ඇත.

පොහෝ දිනයන් මූලික කරගනිමින් ආගමික වැඩසටහන්, සිංහල හින්දු අලුත් අවුරුදු වැඩසටහන්, නිදහස් දින වැඩසටහන්, වෙසක් පොසොන් වැඩසටහන්, තත්තල මූලික කරගනිමින් වැඩසටහන් 2020 වර්ෂයේදී ද ඉදිරිපත් කර ඇති අතර කම්කරු දිනය, මත්ද්‍රව්‍ය නිවාරණ දිනය, කාන්තා දිනය, ලෝක ළමා දිනය ආදී විශේෂ දිනයන් සඳහා ද වැඩසටහන් ඉදිරිපත් කෙරිණි.

වකුගඩු රෝග නිවාරණ විශේෂ වැඩසටහන්, කෘෂිකාර්මික වැඩසටහන් මෙන්ම සංගීත රසාස්වාදනය උදෙසා විශාල වැඩසටහන් ප්‍රමාණයක් ද 2020 වර්ෂයේදී නිෂ්පාදනය කොට ප්‍රචාරයට යොදා ඇත.

කඳුරට සේවය

1983.04.13 ආරම්භ කර ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ කඳුරට සේවය මඟින් 2020 වර්ෂය සඳහා ද ආගමික, සංස්කෘතික, ආර්ථික හා සමාජීය වශයෙන් වැඩසටහන් රාශියක් නිර්මාණය කර ඇත. ආදායම් උත්පාදන වැඩසටහන් මාලාවක් නිෂ්පාදනය කර ඇති අතර අවුරුදු සුබ පැතුම්, සඳහම් ප්‍රදීපනී, දායකත්ව ධර්ම දේශනා, සැරිසර පුරවර, ඇසල විසිතුරු, රාමසාන් වැඩසටහන්, කාලීන වැඩසටහන් ප්‍රචාරය කර ඇත. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුවද 2020 වර්ෂයේදී සියලුම වැඩසටහන් ගුණාත්මකව හා අඛන්ඩව පවත්වාගෙන යාමට කඳුරට සේවය සමත්ව තිබේ. ආසිරි රෝහල හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සේවා දායක අනුග්‍රාහක වැඩසටහන් කීපයක් ප්‍රචාරය කර ඇති අතර දෙමළ භාෂාවෙන් පැය කීපයක් වැඩසටහන් ප්‍රචාරය කර ඇත. මුස්ලිම් වැඩසටහන් සඳහාද කඳුරට සේවා ගුවන්කාලය වෙන් කිරීම 2020 වර්ෂයේදී ද සිදු කර තිබේ.

කදුරට සේවයේ මැදිහත් වීමෙන් කොත්මලේ මාධ්‍ය අධ්‍යයන ආයතනය මඟින් පුහුණු පාඨමාලා 02ක් ක්‍රියාත්මක කිරීම 2020 වර්ෂයේදී සිදු කර ඇති විශේෂ ව්‍යාපෘතියකි.

වයඹ සේවය

FM 90.1 සංඛ්‍යාතය ඔස්සේ වයඹ පලාත මූලික කරගනිමින් විසුරුවා හැරෙන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වයඹ රේඩියෝ දිනපතා උදෑසන 6.00ට ආරම්භ වී සවස 6.00 විකාශය අවසන් කරයි.

වයඹ රේඩියෝ, වයඹ ප්‍රදේශය ආවරණය වන පරිදි පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාවයි. 2020 වර්ෂයේදී ප්‍රාදේශීයව හා ජාතික වශයෙන් වැදගත් කරුණු ඔස්සේ ශ්‍රාවකයාට දැනුම, විඳදනය ලබාදීම අරමුණු කරගනිමින් වයඹ රේඩියෝ සිය විකාශන කටයුතු පවත්වාගෙන ගොස් ඇත. 2020 වර්ෂයේදී වයඹ රේඩියෝ ආරම්භ වසර 11කි.

2020 වර්ෂයේදී ආගමික වැඩසටහන් සඳහා විශේෂ අවස්ථාවක් ලබා දී තිබූ අතර කොරෝනා වසංගත සමය තුළ අධ්‍යාත්මික ශක්තීන් එක් රැස්කර ගැනීම සඳහා විවිධ ධර්මානුශාසනා වැඩසටහන් සහ ඊට අදාල කෙටි නිවේදන වැඩි වශයෙන් ප්‍රචාරයට යොදා ඇත. දිනපතා සඳහම් අසපුව ධර්ම දේශනා හා පෝදා විශේෂ ආගමික වැඩසටහන් ද රතන සූත්‍රය හා ගිරිමානන්ද සූත්‍රය ද වයඹ රේඩියෝ හි ප්‍රචාරයට යොදා ඇත.

2020 වසර පුරා කොරෝනා වසංගතය හා බැඳුණු සෞඛ්‍ය වැඩසටහන් සඳහා විශේෂ අවධානයක් යොමුකර තිබූ අතර සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්, ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන්, කුරුණෑගල ශික්ෂණ රෝහලෙන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන් ලැබෙන විශේෂ නිවේදන හා සජීවී සාකච්ඡා සඳහා වැඩි ගුවන්කාලයක් වෙන් කෙරිණි.

2020 වසරේදී “සළ රූ ගී”, “හිත නැවතුණු තැන”, “මද්දහනේ ගී රිද්ම”, “රසභාරතී” ආදී රසවින්දනාත්මක වැඩසටහන් මෙන්ම වසංගත සමය තුළ ගෙවතු වගාව සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් යුතුව වයඹ ගෙවත්ත වැඩසටහන ද ප්‍රචාරය කර ඇත. වසංගත සමය තුළ නිවෙස්වල සිටින දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් “වයඹ රේඩියෝ ගුරුවරයා” වැඩසටන, “වයඹ සිප්මන්සල”, “සිසු දිරිය” ආදී අධ්‍යාපන වැඩසටහන් රාශියක් ද විශේෂ කාලීන වැඩසටහන් ගණනාවක් ද “ළමා උයන” ළමා වැඩසටහන ද වාර්ෂික විශේෂ දින අලලා විවිධ විශේෂ වැඩසටහන් ගණනාවක් ද ප්‍රචාරය කර ඇත.

දඹාන සේවය

ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාවගේ අනන්‍යතාවය, සංස්කෘතික උරුමය සහ විශේෂයෙන්ම වැදි භාෂාව සංරක්ෂණය කරමින් ඉදිරියට පවත්වාගෙන යාමේ අරමුණින් 1986.04.11 ආරම්භ කර ඇති රේඩියෝ දඹාන, වසර ගණනාවක සිට තම වගකීම මනාව ඉටු කර ඇති අතර 2020 වර්ෂයේදී ද වැඩසටහන් ගණනාවක් නිෂ්පාදනය කර ප්‍රචාරයට යොදා ඇත. මූලික වශයෙන් භාෂාව, කලාකෘති, සංස්කෘතිකාංග සංරක්ෂණය කිරීම මෙන්ම ඉදිරි පරපුරට එහි වැදගත්කම හඳුන්වා දෙමින් තවදුරත් පවත්වාගෙන යාම මෙම වැඩසටහන්වල අරමුණ වේ.

2020 වර්ෂයේදී වැදි නායකතුමාගේ ඉල්ලීම මත වැදිගෝත්‍රික වැඩසටහන් ශ්‍රවණ කලාපය වැඩි කිරීම සඳහා ජාතික ගුවන්විදුලියේ නාලිකා හා ප්‍රාදේශීය නාලිකා උපයෝගී කර ගැනීමට රේඩියෝ දඹාන කටයුතු කර ඇත. ඒ අනුව රේඩියෝ දඹාන මූලිකත්වයෙන් සෑම සිකුරාදා දිනකම පස්වරු 1.15 සිට 2.15 දක්වා කඳුරට සේවය ඔස්සේ “වැදි රටින් කඳු රටට” වැඩසටහන හා සෑම සිකුරාදා දිනකම සවස 3.30ට වෙළඳ සේවයෙන් “කඳ අරණ” (මීපැණි) වැඩසටහන ප්‍රචාරය කර ඇත.

පිරෙයි එෆ් එම්

අක්කරෙයිපත්තු ප්‍රාදේශීය ගුවන්විදුලිය ලෙස 2005.11.04 සිට ක්‍රියාත්මක පිරෙයි එෆ් එම් සේවය, 2020 වර්ෂයේදී සේවාදායක වැඩසටහන් ඔස්සේ රු. 5,096,325.94 ක ආදායමක් උත්පාදනය කර දී තිබේ.

අක්කරෙයිපත්තු ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාව ලෙස පිරෙයි එෆ් එම් සේවය ක්‍රියාත්මක වේ. 2018 වර්ෂයේදී ද සේවාදායක වැඩසටහන් රාශියක් මගින් සංස්ථාවට ආදායම් උත්පාදනය කර දීමට පිරෙයි එෆ් එම් සමත් වී ඇත. ප්‍රාදේශීයව වැදගත්වන වැඩසටහන් සේම ජාතික වැදගත්මක් ඇති වැඩසටහන් ද විකාශය කර ඇති අතර දේශීයව හා ජාත්‍යන්තරව වැදගත්කමක් ඇති දින, සිදුවීම් ආදිය පිළිබඳව වැඩසටහන් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව විවිධ ආගමික උත්සව, ක්‍රීඩා වැඩසටහන් විකාශය කිරීමද සිදුව ඇත.

විශේෂයෙන් මුස්ලිම් ප්‍රජාව වැඩි වශයෙන් ජීවත් වන අක්කරෙයිපත්තු ප්‍රදේශය හා දෙමළ භාෂාව වැඩි වශයෙන් කතා කරන ප්‍රජාවක් ජීවත්වන නැගෙනහිර පළාත පිරෙයි එෆ් එම් හි ඉලක්කගත ශ්‍රාවකයින් වනර අතර ඔවුන්ගේ විශේෂ ප්‍රසාදය පවත්වාගෙන යාමට අදාළව වැඩසටහන් රාශියක් නිෂ්පාදනය කොට විකාශය කිරීමට 2020 වර්ෂයේදී පිරෙයි එෆ් එම් සේවය සමත් වී ඇත.

ඉංජිනේරු අංශය

ගුවන්විදුලි සංස්ථා ඉංජිනේරු අංශය මඟින් 2020 වර්ෂය තුළ ඉටුකරන ලද කාර්යයන්.

- ✓ යාපනය සේවය සඳහා ට්‍රාන්ස්මීටර් 02ක් මිලදී ගැනීම.
  ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 6.9කි.

- ✓ ප්‍රධාන කාර්යාලයේ සහ බාහිර විකාශනාගාරවල ස්ථාපිත තාක්ෂණික උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස් / උපාංග මිලදී ගැනීම.
  ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 3.54කි.

- ✓ පුත්තලම විකාශනාගාරයේ සහ කරඹෙවත්ත ඉඩම අතර වැඩක් ඉදිකිරීම.
  ව්‍යාපෘතියේ වටිනාකම රු.350,000.00කි

අලෙවි අංශය

2021 වර්ෂය, අභියෝග රැසක් සමඟ අලෙවි අංශයේ කටයුතු පවත්වාගෙන ගිය වර්ෂයක් ලෙස දැක්විය හැක. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රට වසා තැබීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට වසර පුරාම අසීරු විය. කෙසේ වෙතත් 2019 වර්ෂයේ ආරම්භකළ “කටහඬට අරුතක්” ප්‍රවර්ධන වැඩසටහන සාර්ථක කර ගැනීමට 2020 වර්ෂයේ හැකි විය. ඒ අනුව විධිමත් හඬ පරීක්ෂණ මාලාවක් මඟින් තෝරාගත් පිරිස, විධිමත් පුහුණුවකින් අනතුරුව නව සන්නිවේදන කණ්ඩායමක් රටට දායාද කිරීමේ ක්‍රියාන්විතය සාර්ථකව සිදුවිය.

කොරෝනා වසංගතය හමුවේ පීඩා විඳින ලාංකික මෙන්ම ලෝකවාසී ජනතාවට සෙත්පතා දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි විහාරස්ථානවල සිට සජීවීව රතනසූත්‍රය සජ්ඣායනය කිරීම 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මස 23 වන දින ආරම්භ කළ අතර සිටි එෆ් එම් සේවය, වෙළඳ සේවය හා ප්‍රාදේශීය සේවාවන් ඒකාබද්ධව සෑම දිනකම ප.ව. 6.30-7.30 කාලය අතර සජීවීව ප්‍රචාරය කරන ලදී. එම වැඩසටහනේ සම්පූර්ණ මෙහෙයවීම අලෙවි අංශය විසින් සිදු කළ අතර ප්‍රචාරණ වැඩසටහනක් වශයෙන් සංස්ථාවේ නාලිකා කෙරෙහි ඒ මඟින් ගුණාත්මක බලපෑමක් ඇති කර ඇත.

මෙම කාලපරිච්ඡේදය පුරා මාස ගණනාවක් කායිකව හා මානසිකව පීඩා විඳින ජනතාවට තරමක හෝ අස්වැසිල්ලක් ලබාදීම සඳහා නිරන්තරයෙන් ගුවන්විදුලි සංස්ථාව සමඟ අත්වැලි බැඳගෙන සිටින සේවාදායක ආයතන, අලෙවි නියෝජිත ආයතන ප්‍රධානීන් ඒකරාශී කරගනිමින් සංවිධානය

කළ "වැයුම් ගීතාව" විශේෂ සංගීතමය වැඩසටහන මෙම වර්ෂය අවසානයේ ක්‍රියාත්මක කළ අතර ගුවන්විදුලි සංස්ථා සංගීත අංශය එම වැඩසටහනේ නිෂ්පාදන දායකත්වය සැපයීය.

විස්සයි විස්ස ලංකා ප්‍රිමියර් ලීග් (LPL) තරගාවලිය 2020 වර්ෂයේ පැවැත්වූ අතර ක්‍රීඩා අංශය සමඟ එක්ව එම තරගාවලිය පුළුල් ප්‍රචාරයක් සමඟ සජීවී විස්තර විචාරය විකාශය කිරීමට අලෙවි අංශය කටයුතු කර ඇත.

ප්‍රකාශන අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රකාශන, නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත්තේ ප්‍රකාශන අංශය වෙතයි. 2020 වර්ෂය තුළ නව ප්‍රකාශන කිසිවක් නිෂ්පාදනය කිරීම සිදු කර නොමැති අතර, පෙර සිට නිෂ්පාදනය කර ඇති සංස්ථා ප්‍රකාශන අලෙවිය සිදු කර ඇතත් කොරෝනා වසංගත තත්ත්වය හමුවේ රට වසා තැබීම, ප්‍රසංග, අධ්‍යාපනික හෝ වෙනත් ප්‍රදර්ශන ආදිය නොපැවැත්වීම හේතුවෙන් අලෙවි ආදායම විශාල වශයෙන් අඩු විය.

2020 වර්ෂයේදී ද ගුවන්විදුලි සංස්ථා අලෙවි නියෝජිත ජාලය ඔස්සේ සහ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී ද ගුවන්විදුලි සංස්ථා ප්‍රකාශන වන, සංයුක්ත තැටි සහ හඬ සඟරාව අලෙවි කර ඇත. ඊට අමතරව ගුවන්විදුලි සංස්ථා ප්‍රාදේශීය නියෝජිත ජාලය සම්බන්ධ වැඩමුළුවේදී සංස්ථා ප්‍රකාශන අලෙවි කිරීම, රේඩියෝ ගුරුවරයා සම්මන්ත්‍රණ මාලාවේ ටිකටිපත් අලෙවිය, නොමියෙන මිනිසුන් පොත එළිදැක්වීමේදී ජාතියේ සන්නිවේදකයා සඟරාව අලෙවිය 2020 වසරේදී සිදුව ඇත. ප්‍රාදේශීය සේවා ඔස්සේ ද ගුවන්විදුලි ප්‍රකාශන අලෙවියට කටයුතු යොදනු ලැබිණි. ඊට අමතරව ධර්මදේශනා සංයුක්ත තැටි අලෙවිය ද සිදු කර ඇත.

95 වන ගුවන්විදුලි සංවත්සරය වෙනුවෙන් යුග යුග හඳ බැඳි ගීත 95ක PEN DRIVE එකක් නිර්මාණය කිරීම 2020 වසරේ සිදු කළ නව නිෂ්පාදනයකි.

ප්‍රකාශන අංශයේ 2020 වාර්ෂික ආදායම, රුපියල් 1,597,405.60 කි.

ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය

වඩාත් විශ්වසනීය පුවත් වගකීමෙන් හා එසැණින් ජනතාව වෙත ලබා දීම ජාතික ගුවන්විදුලියේ ප්‍රවෘත්ති අංශය වෙත පැවරී ඇති වගකීමයි. දිනපතා එක් භාෂාවකින් ප්‍රවෘත්ති ප්‍රකාශ 4ක් ප්‍රචාරය කර ඇති අතර භාෂා තුනෙන් දිනකට ප්‍රචාරය වන ප්‍රවෘත්ති ප්‍රකාශ සංඛ්‍යාව 12කි. 2020 වර්ෂය තුළ, කොරෝනා වසංගතය හමුවේ ඉතා අවම කාර්ය මණ්ඩලයක් යොදා ගනිමින් කිසිදු කප්පාදුවකින් තොරව, පෙර වර්ෂයන්හි මෙන්ම, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ප්‍රවෘත්ති ප්‍රකාශ

4464ක් ප්‍රචාරය කර ඇත. ඊට අමතරව දිනකට එක් භාෂාවකින් පැයේ පුවත් ප්‍රකාශ 12ක් ප්‍රචාරය වේ. ඒ අනුව භාෂා තුනෙන් දිනකට පැයේ පුවත් ප්‍රකාශ 36ක් ප්‍රචාරය වී ඇත.

ඊට අමතරව දිනපොත, ළමා ප්‍රවෘත්ති ආදිය ඉදිරිපත් කිරීම ද ප්‍රවෘත්ති අංශයේ අධීක්ෂණය යටතේ විකාශය වේ. සුභාරතී, ඇතුල්පැත්ත, සත්‍යෝයක්ෂණය ආදී කාලීන දේශපාලනික සිදුවීම් අනුසාරයෙන් වන සාකච්ඡාමය වැඩසටහන් ද ප්‍රවෘත්ති අංශය විසින් නිෂ්පාදනය කර ප්‍රචාරයට යොදා ඇත. රජයේ සංවර්ධන කටයුතු ජනතාව අතරට ගෙනයාම අරමුණු කරගනිමින් විශේෂ ප්‍රවෘත්ති සම්පාදනය කර ප්‍රචාරය කිරීම 2020 වර්ෂය තුලදී සිදුකර ඇත.

සංවර්ධන ඒකකය

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2020.01.01 දින සිට 2020.12.31 දක්වා සහභාගී වූ විවිධ උත්සව සඳහා මාධ්‍ය ආවරණය ලබාදීමේ කටයුතු සංවර්ධන ඒකකය විසින් ඉටු කර ඇත. 2020 වර්ෂය පුරා ජනාධිපතිතුමා විසින් විශේෂ අවස්ථාවන්හිදී පවත්වන ලද කතා සංස්කරණය කොට අවශ්‍ය පරිදි ප්‍රචාරය කිරීම සිදු කර ඇති අතර එවා සියල්ලම සංරක්ෂණය කිරීමටද කටයුතු යොදා තිබේ. ඊට අමතරව ජනාධිපතිතුමා සහභාගීවන විශේෂ උත්සව සම්බන්ධයෙන් පූර්ව නිවේදන සකස් කොට ප්‍රචාරයට යෙදීම හා එම උත්සව සජීවී ප්‍රචාරය සඳහා සම්බන්ධීකරණය සංවර්ධන ඒකකය විසින් ඉටු කර ඇත.

ජනාධිපතිතුමා විසින් 08 වන පාර්ලිමේන්තුවේ 04 වන සැසිවාරය ඇමතීම, 72 වන නිදහස් සමරු උළෙල, නොබැඳි ජාතීන්ගේ ඔන්ලයින් නායක සමුළුව, ලෝක කම්කරු සංවිධානයේ ගෝලීය සමුළුව ඇමතීම, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 75 වන සැසිවාරය ඇමතීම ඇතුළුව ජනාධිපතිතුමා විසින් සිදු කරන ලද සියලුම කතා සංවර්ධන ඒකකය මඟින් ආවරණය කර ඇත.

සංගීත අංශය

ගුවන්විදුලි සංස්ථාවේ සෑම නාලිකාවක් ඔස්සේම ගුණාත්මක සංගීත වැඩසටහන් ඉදිරිපත් කරමින් ශ්‍රාවකයින් වෙත ඉතා උසස් රසවින්දනයක් ලබාදීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා සංගීත අංශය 2020 වර්ෂයේදී ද වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

72 ව ජාතික දිනය නිමිත්තෙන් විනාඩි 30ක විචිත්‍රාංග වැඩසටහනක් නිෂ්පාදන කොට ප්‍රචාරය කරන ලද අතර ඊට සමගාමීව නිදහස් ගීත දෙකක් ද අලුතින් පටිගත කොට ප්‍රචාරයට යොදා ඇත.

ව්‍යාපාර ප්‍රජාවගේ ආකර්ශනය විවිධ වැඩසටහන් වෙත ලබා ගැනීමේ අරමුණින් "වැයුම් ගීතාව" වැඩසටහන, සම්ප්‍රදායික ජන ගායනා, ජන ගී ප්‍රතිනිර්මාණය හා ජන සංගීතය ඇසුරින් නිර්මාණය වූ ගීත ඇතුළත් කොට "හෙළ ගී මිහිර" වැඩසටහන ද නූර්ති ගී, නාඩගම් ගී හා පැරණි හා නව වේදිකා නාට්‍ය ගී ඇතුළත් කොට "රංගරාව" වැඩසටහන ද උත්තර භාරතීය රාගධාරී සංගීතාංග ඇතුළත් "සරසරාවය" වැඩසටහන ද බුදු සිරිතේ විවිධ අවස්ථා ගෙනහැර පාමින් බැති ගී විග්‍රහයකින් සමන්විත "ශ්‍රද්ධාංජලී" වැඩසටහන ද ලොව පහළ ව විශිෂ්ටතම සංගීතඥයිගේ නිර්මාණ ඇසුරු කරමින් "විශ්වයේ වින්දනීය ප්‍රතිරාව" වැඩසටහන ද රාජය හා පුද්ගලික අංශවල සේවක හැකියාවන් එළිදැක්වීමට අවස්ථාව සලසමින් "සේවක සංග්‍රහය" වැඩසටහන ද පොහෝ දිනවල "ධම්මපද ගී" වැඩසටහන් මාලාවද, සුභාවිත ගීතය වැඩසටහන, ඉරිදා සංග්‍රහය, ලලිත කලාලය අධ්‍යාපනික වැඩසහටන, භක්ති පූජා වැඩසටහන සරසවි සර වැඩසටහන 2020 වර්ෂය තුළ සංගීත අංශය විසින් නිෂ්පාදනය කර ප්‍රචාරයට යොදා ඇති වැඩසටහන් වේ.

ඊට අමතරව කතරගම ඇසල පෙරහැර, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් සහ සිටි එෆ්. එම්. සේවය වෙනුවෙන් තේමා ගීත නිර්මාණය කිරීමද 2020 වර්ෂයේ සංගීත අංශය විසින් ඉටු කර ඇති විශේෂ නිර්මාණ කාර්යයන් වේ.

ශ්‍රවණ පර්යේෂණ අංශය

ගුවන්විදුලි සංස්ථාවේ දේශීය සේවාවන්හි වැඩසටහන්වල ගුණාත්මක භාවය, ශ්‍රවණ තත්ත්වය හා ශ්‍රාවක ප්‍රජාව ආදිය පිළිබඳව සමීක්ෂණය කිරීම හා ඊට විසඳුම් යෝජනා කිරීම ශ්‍රවණ පර්යේෂණ අංශයේ රාජකාරිය වේ. ඒ අනුව 2020 වර්ෂයේදී ද දේශීය සේවාවන්වල ප්‍රචාරය වන වැඩසටහන්වල ශ්‍රවණ තත්ත්වය, ගුණාත්මක භාවය, ශ්‍රාවක ප්‍රතිචාර ආදිය සම්බන්ධ සමීක්ෂණ අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. දෛනික වැදගත් තොරතුරු ඉදිරිපත් කිරීම, අධ්‍යාපනික අවශ්‍යතා සඳහා පැමිණෙන ශිෂ්‍යයින්ට අවශ්‍ය දැනුම ලබා දීම, ගුවන්විදුලි සංස්ථාව පිළිබඳ අත්පත්‍රිකාව යාවත්කාලීන කිරීම 2020 වර්ෂයේදී ද සිදු කර ඇත.

පුහුණු හා විදේශ සම්බන්ධතා අංශය

මධ්‍යම ක්‍රියාකාරී අංශය

2020 වර්ෂය තුළ මධ්‍යම ක්‍රියාකාරී අංශය, ගුවන්විදුලි සංස්ථාවේ අරමුණු කරා ලහා වීමට සුවිශේෂී ආයතනික මෙහෙවරක් ඉටු කර ඇති අතර සිංහල, දෙමළ, ඉංග්‍රීසි, හින්දි, තෙළඟු සහ මලයාලම් භාෂාවලට අයත් විවිධත්වයෙන් යුත් වැඩසටහන් පටිගත කිරීම, සංස්කරණය කිරීම,

බාහිර පටිගත කිරීම, සජීවී සම්බන්ධතා මැදිරිවල වැඩසටහන් ගුණාත්මක බවින් ඉහළ තලයක පවත්වාගෙන යමින් විකාශනයට සහය වීම හා වෙළඳ දැන්වීම් නිෂ්පාදනය කිරීම, ඒවා ඉතා කාර්යක්ෂමව දෛනික වෙළඳ පත්‍රිකාවේ පරිදි ප්‍රචාරයට සහය වෙමින් ආයතනයේ අනන්‍යතාව රැකගනිමින් තාක්ෂණික මෙහෙවරින් දායකවීම ඇතුළු තම අංශය වෙත පැවරී ඇති අති විශාල කාර්ය භාරය විධිමත් හා කාර්යක්ෂම ලෙස ඉටු කර ඇත. මෙම කටයුතු සඳහා වැඩසටහන් නිෂ්පාදකවරුන් තාක්ෂණික දායකත්වය සපයන අතර මැදිරි සේවා කාර්ය මණ්ඩලය විසින් මැදිරිවලට අවශ්‍ය සේවා පහසුකම් සැපයීම සිදු කර ඇත.

2020 වසර පුරා පැවති කොරෝනා වසංගතය හමුවේ අවම කාර්ය මණ්ඩලයක් යොදවා ගනිමින් සංස්ථාවේ සියලුම සේවාවන් හා මැදිරි පවත්වාගෙන යාම සඳහා මධ්‍යම ක්‍රියාකාරී අංශය සුවිශාල මෙහෙයක් ඉටු කර ඇත.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ දුෂ්කර පළාත් සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට සක්‍රීයව දායක වීම, එම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ගමට හඬක් වැඩසටහන සඳහා දායකත්වය සැපයීම, වසංගත සමයේ ගුණාත්ම වැඩසටහන් ඉදිරිපත් කිරීම තුළින් ජනතාවගේ රසවින්දනය හා මානසික සුවතාවය පවත්වාගැනීමට සහය වීම 2020 වසරේ මධ්‍යම ක්‍රියාකාරී අංශය විසින් ඉටු කළ විශේෂ රාජකාරි වේ.

2020 ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙලේදී ප්‍රශස්ත ගුවන්විදුලි නාට්‍ය රචනයට හිමි සම්මානය, මධ්‍යම ක්‍රියාකාරී අංශයේ වැඩසටහන් නිෂ්පාදන සහායක මලින්ත දේශප්‍රිය මහතාට ද ප්‍රශස්ත නාද ශික්ෂණයට හිමි සම්මානය මධ්‍යම ක්‍රියාකාරී අංශයේ වැඩසටහන් නිෂ්පාදන සහායක තරිඳු දිසානායක මහතාට ද හිමි විය.

<u>වසරේ මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ සංක්ෂිප්ත සටහන</u>

සමාලෝචිත 2020 වර්ෂය ආරම්භ වන විට ගෝලීය වශයෙන් කොරෝනා වසංගතය ව්‍යාප්තව පැවතෙමින් තිබූ අතර 2020 මාර්තු මාසය වන විට ශ්‍රී ලංකාව තුළ ද වෛරසයේ බලපෑම පැතිරෙන්නට විය. එම තත්ත්වය හමුවේ සංචරණ සීමා, රට වසා දැමීම, ආයතනයේ සේවක සේවිකාවන් කොරෝනා වසංගතයට ගොදුරු වීම හා රටතුළ උද්ගත වූ ආර්ථික අවපාතයත් සමඟ අනුග්‍රාහක දැන්වීමවල ශීඝ්‍ර පහත වැටීම ආදී සාධක ද සමඟ 2020 වර්ෂය ඉදිරියට ඇදුණු අතර ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව රාජ්‍ය මාධ්‍ය ආයතනයක් ලෙස අඛණ්ඩව සිය මාධ්‍ය මෙහෙවර ඉටු කර ඇත. ආයතනයේ ආදායම් තත්ත්වය පහත වැටෙමින් තිබූ අවදියක් වුවද අවම සේවක සංඛ්‍යාවක් යොදවා ගනිමින්, සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය සියලුම යටිතල

පහසුකම් ලබා දෙමින්, ගුණාත්මක ලෙස සියලුම නාලිකාවන් සුපුරුදු පරිදි පවත්වාගෙන යාමට කටයුතු කිරීම 2020 වර්ෂයේ සංස්ථාව ලද ජයග්‍රහණයකි.

2020 වර්ෂයේ රට වසා දැමීම සමඟ පාසැල් අධ්‍යාපනයට එල්ලවූ බලපෑම යම් පමණකින් හෝ සමනය කරවීම උදෙසා ජාතික ගුවන්විදුලිය සිය වගකීම මැනවින් ඉටු කරමින් රේඩියෝ ගුරුවරයා යන සංකල්පය යටතේ භාෂාත්‍රයෙන් අධ්‍යාපන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කර ඇත. ඒ ඔස්සේ සියලුම නාලිකා මඟින් දෛනිකව පැය 20ක් ආවරණය වන පරිදි පාසල් විෂය නිර්දේශ ආවරණය කරමින් මෙම වැඩසටහන් මාලාව ක්‍රියාත්මක විය.

2020 වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් සම්බන්ධ කරගනිමින් ප්‍රාදේශීය වාර්තාකරුවන් සඳහා වැඩමුළු පවත්වා ප්‍රාදේශීය වාර්තාකරු ජාලය ශක්තිමත් කර ඇත.

2020 දෙසැම්බර් මස 16 වන දින ගුවන්විදුලි සංස්ථාව 95 වන වසර සැපිරීමට සමගාමීව තැපැල් මුද්දරයක් නිකුත් කිරීම, ඕකිඩ් පැලයක් නම් කිරීම, ගුවන්විදුලි තොරතුරු ඇතුළත් සඟරාවක් මුද්‍රණය කිරීම සහ සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් හා සියක් නමක් විෂයෙහි සාංගීක දානයමය පිංකමක් ද සිදු කෙරිණි. 95 වසර වෙනුවෙන් හින්දු, කතෝලික හා මුස්ලිම් ආගමික වැඩසටහන් ද ක්‍රියාත්මක කළ අතර නව ගුවන්විදුලි ගීතයක් නිර්මාණය කිරීම ද සිදුවිය.

ගිණුම් ප්‍රකාශනය - 2020

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

	සටහන	2020	2019
		දෙසැම්බර් 31 දිනට	දෙසැම්බර් 31 දිනට
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**9**	1,931,845,654	2,163,754,346
විලම්බිත බදු වත්කම්	**8**	13,224,803	10,852,398
මෘදුකාංග	**9**	3,352,811	9,859,004
සිදුකෙරෙමින් ඇති ප්‍රාග්ධන වැඩ	**10**	14,877,019	17,032,793
ස්ථාවර තැන්පතු		84,485,018	77,023,784
ආයෝජන	**11**	1,000,000	1,000,000
		2,048,785,305	**2,279,522,325**
ජංගම වත්කම්			
ඉන්වෙන්ටරි	**12**	21,632,281	20,025,662
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ	**13**	266,775,612	235,393,552
මුදල් හා මුදල්වලට සමාන දේ	**14**	92,678,923	116,175,232
		381,086,816	**371,594,446**
මුළු වත්කම්		**2,429,872,121**	**2,651,116,771**
ස්කන්ධ ප්‍රාග්ධනය හා බැරකම්			
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රාකාශිත ප්‍රාග්ධනය		307,386,085	307,386,085
ප්‍රත්‍යාගණන සංචිත		11,971,999	11,971,999
රඳවාගත් ඉපැයීම්	**15**	(547,771,519)	(475,784,467)
		(228,413,435)	**(156,426,383)**
අවිනිශ්චිත බැරකම්			11,783,507
ජංගම නොවන බැරකම්			
නිශ්චිත ප්‍රතිලාභී වගකීම්	**21**	282,412,178	232,428,448
විදේශ ප්‍රදාන	**20**	695,263,936	857,697,784
රජයේ ප්‍රදාන		750,821,314	827,690,965
අනෙකුත් ගෙවිය යුතු දේ	**19**	8,539,635	8,551,384
විලම්බිත බදු බැරකම්	**8**	405,762,153	407,291,664
		2,142,799,216	**2,333,660,245**
ජංගම බැරකම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ	**16**	348,045,579	317,343,760
කෙටි කාලීන ණය ගැනීම්	**17**	54,324,046	36,925,978
මූල්‍යමය නොවන බැරකම්	**18**	113,116,715	107,829,664
මුළු බැරකම්		**515,486,340**	**462,099,402**
මුළු ස්කන්ධය හා බැරකම්		**2,429,872,121**	**2,651,116,771**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1996 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනතේ විධිවිධානවලට අනුකූල වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බවට මුදල් අධ්‍යක්ෂ සහතික කරයි.

ලලිත් හෙට්ටිගේ මහතා
අධ්‍යක්ෂ මුදල්

දිනය: 2021-8-03

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු ය.
මෙම මූල්‍ය ප්‍රකාශ 2020 ජූනි මස 17වැනි දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

හඬිසන් සමරසිංහ
සභාපති
දිනය: 3/12/2021

අධ්‍යක්ෂ මණ්ඩලය
දිනය:.....

අධ්‍යක්ෂ මණ්ඩලය
දිනය:.....

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

	සටහන	2020 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	ගැලපීම්	2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
විකුණුම්	1	**545,090,863**	**659,857,071**		**659,857,071**
විකුණුම් පිරිවැය	2	**537,608,568**	**644,632,855**		644,632,855
දළ ලාභය		**7,482,295**	**15,224,215**		**15,224,215**
වෙනත් මෙහෙයුම් ආදායම්	3	**346,439,569**	**350,298,093**		**350,298,093**
බෙදාහැරීමේ පිරිවැය	4	**6,431,070**	**-**		**0**
වෙනත් මෙහෙයුම් පිරිවැය	5	**371,269,073**	**359,298,881**		**359,298,881**
පරිපාලන වියදම්	6	**424,364,297**	**392,655,593**		**392,655,593**
මෙහෙයුම් ලාභය		**(448,142,577)**	**(386,432,165)**		**(386,432,165)**
මූල්‍ය පිරිවැය	7	**5,984,176**	**4,073,406**		**4,073,406**
රජයේ ප්‍රදානවලට පෙර ලාභය/ (අලාභය)		**(454,126,752)**	**(390,505,571)**		**(390,505,571)**
රජයේ ප්‍රදාන	3.1	**440,000,000**	**365,000,000**		**365,000,000**
රජයේ ප්‍රදානවලට පසු ලාභය/ (අලාභය)		**(14,126,752)**	**(25,505,571)**		**(25,505,571)**
විලම්බිත බදු	8	**3,901,917**	**108,913,196**	**127,837,208**	**(18,924,012)**
වෙනත් විස්තීර්ණ ආදායම්	21	**(61,720,242)**	**(56,569,495)**		**(56,569,495)**
බදු පසු ලාභය		**(71,945,077)**	**26,838,130**		**(100,999,078)**
මුළු විස්තීර්ණ ආදායම		**(71,945,077)**	**26,838,130**		**(100,999,078)**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

	ප්‍රකාශිත ප්‍රාග්ධන	ප්‍රත්‍යාගණන සංචිත		රඳවාගත් ඉපැයීම්	එකතුව
2018 ජනවාරි 1වැනි දිනට ශේෂය	307,386,085	14,421,999		(55,470,045)	266,338,039
විස්තීරණ ආදායම				(42,670,112)	(42,670,112)
ප්‍රාග්ධන සංචිත					-
රඳවාගත් ඉපැයීම්		(2,450,000)			(2,450,000)
ගැලපීම්				(276,645,232)	(276,645,232)
2018 දෙසැම්බර් මස 31 දිනට ශේෂය	**307,386,085**	**11,971,999**	**-**	**(374,785,389)**	**(55,427,305)**
2019 ජනවාරි මස 1වැනි දිනට ශේෂය	307,386,085	11,971,999	-	(374,785,389)	(55,427,305)
විස්තීර්ණ ආදායම					
විස්තීර්ණ ආදායම				26,838,130	26,838,130
ආදායම් සංචිතය				(127,837,208)	(127,837,208)
2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය	**307,386,085**	**11,971,999**		**(475,784,467)**	**(156,426,383)**
2020 ජනවාරි මස 1වැනි දිනට ශේෂය	307,386,085	11,971,999		(475,784,467)	(156,426,383)
විස්තීර්ණ ආදායම					
කාලසීමාව සඳහා විස්තීර්ණ ආදායම				(71,945,077)	(71,945,077)
ආදායම් සංචිතය				(41,975)	(41,975)
2020 දෙසැම්බර් මස 31 දිනට ශේෂය	**307,386,085**	**11,971,999**		**(547,771,519)**	**(228,413,435)**

2020 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	2020		2019	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
බදු සහ පොලියට පෙර ශුද්ධ ලාභය		(14,126,752)		(29,370,449)
ගැලපීම්				
රජයේ ප්‍රදානයේ ක්‍රමක්ෂය	(121,987,376)		(107,878,577)	
ත්‍රිකුණාමල ප්‍රදානයේ ක්‍රමක්ෂය	(155,406,674)		(155,406,674)	
ක්ෂයවීම	113,424,212		97,492,400	
ක්ෂයවීම් - ත්‍රිකුණාමලය	161,429,772		161,224,994	
මෘදුකාංග ක්‍රමක්ෂය	6,506,193		2,913,028	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	31,675,127		30,471,666	
බොල් ණය සඳහා ප්‍රතිපාදන	5,027,070		(1,958,535)	
බැහැර කරන වත්කම්			(8,592,717)	
විනිමය මත ලාභ/(අලාභය)	213,424		(81,301)	
ESC		40,881,748	3,669,880	21,854,163
		26,754,996		(7,516,286)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභ				
ඉන්වෙන්ට්‍රි හාණ්ඩ වැඩිවීම/ අඩුවීම	(1,606,618)		27,092,425	
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	(36,219,210)		14,300,009	
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	18,906,563		(7,147,905)	
මූල්‍යමය නොවන බැරකම්වල වැඩිවීම/ අඩුවීම	5,222,674	(13,696,591)	(14,555,138)	19,689,390
				12,173,104
ගෙවන ලද පාරිතෝෂික		(41,206,888)		(54,935,519)
මෙහෙයුම් ක්‍රියායාකාරකම්වලින් ශුද්ධ මුදල්		**(28,148,483)**		(42,762,414)
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය				
ස්ථාවර තැන්පතු පොලිය	(7,461,234)		(7,205,599)	
රජයේ ප්‍රදාන	38,090,551		126,000,000	
බැහැර කරන වත්කම්			7,352,777	
දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම	(43,185,291)		(162,910,503)	
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ			(3,235,774)	
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ		(12,555,974)		(39,999,099)
මුදල් හා මුදල් සමාන දෑ වල වැඩිවීම/ අඩුවීම		(40,704,458)		(82,761,513)
කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		79,059,335		161,820,848
කාලසීමාව අවසානයේ මුදල් මුදල් සමාන දෑ (සටහන 14)		**38,354,877**		**79,059,335**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. පොදු තොරතුරු

1.1 වාර්තාකරණ අස්ථීත්වය

1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ නිසි පරිදි සංස්ථා කොට ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික කටයුතු සිදු කරන ස්ථානය කොළඹ 07, නිදහස් චතුරශ්‍රය් පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ගුවන් කාලය විකිණීමයි.

1.3 නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය

2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ 2020 ජුනි මස 17 දින අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

1.4 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානය වන විට ස්ථීර සේවක සංඛ්‍යාව 677ක් වූ අතර කොන්ත්‍රාත් පදනමින් සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 93ක් විය.
(31.12.2019 – 791)

2. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ('SLFRS") සකස් කිරීමේ සහ සම්මත කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("SLFRS") සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත ප්‍රකාරව සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("SLFRS') නව වෙළුමක් නිකුත් කර ඇති අතර 2021 ජනවාරි මස 01වැනි දින සිට හෝ ඉන් අනතුරුව ආරම්භ වන වර්ෂය සඳහා බලාත්මක වන පරිදි ව්‍යවසායකයින් විසින් මෙම මෙම ප්‍රමිති අදාළ කර ගැනීමට අවශ්‍ය වේ.

3. 1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත විස්තර කොට ඇත. අන් ආකාරයකින් සඳහන් කොට ඇත්තේ නම් මිස, ඉදිරිපත් කර ඇති සියලුම වසර සඳහා මෙම ප්‍රතිපත්ති ඒකාකාරව භාවිතා කර ඇත.

3.1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS for SMEs) අනුකූලවයි. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික

පිරිවැය සහ මෙහි පසුව පැහැදිලි කොට ඇති අනෙකුත් නිශ්චිත මිනුම් යටතේ පිළියෙළ කර ඇත.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපාන උද්ධමන සාධක වෙනුවෙන් ගැලපීම් සිදු කොට නොමැත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කළ යුතුය. තව ද, ගුවන්විදුලි සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගත කිරීමේ ක්‍රියාවලියෙහි දී කළමනාකාරීත්වය විසින් සිය විනිශ්චය ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඇති උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර සටහන 4හි හෙළිදරව් කොට ඇත. ඊට වත්කම් සහ බැරකම් හෙළිදරව් කිරීම සහ වාර්තාකරණ කාලසීමාව තුළ ආදායම සහ වියදම් ප්‍රමාණ පිළිබඳ වාර්තාව අයත් වේ. වර්තමාන සිදුවීම් සහ ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකාරීත්වයේ උපරිම දැනුම මත මෙම ඇස්තමේන්තු පාදක වුව ද, අවසානයේ දී තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැකිය.

3.1.2 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සංස්ථාවට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමක් සිදු කර ඇති අතර ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරති.

3.1.3 පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම්

ශේෂපත්‍ර දිනයට පසුව සිදු වූ සියලුම සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කර හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

3.1.4 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව මඟින් ඒකාකාරීව යොදා ගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් ආකාරයකින් සඳහන් කර ඇත්තේ නම් මිස, පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ අනුරූප වේ. සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කිරීම සමඟ අනුකූල වන පරිදි අවශ්‍ය ස්ථානයන් හි දී පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.

3.1.5 විදේශීය ව්‍යවහාර මුදල්

(අ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අයිතම මනිනු ලබන්නේ අස්ථිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය යොදා ගනිමිනි ("කෘත්‍යාත්මක මුදල් ඒකකය"). මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ සංස්ථාවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලිනි.

(ආ) විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

විදේශීය මුදල් ගනුදෙනු එම ගනුදෙනුව සිදු කරන ලද දිනයන් හි පැවති විනිමය අනුපාතය හෝ අයිතම මනිනු ලබන අවස්ථාවන් හි වටිනාකම යොදා ගනිමින් කෘත්‍යාත්මක මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එම ගනුදෙනු බේරුම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශ මුදලින් අභිධානය කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වර්ෂය අවසානයේ විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමේ දී ඇති වන විදේශ විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී.

3.2 වෙනත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිත්ති

3.2.1 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම්

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වනුයේ මුදල් සහ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතුවල සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුළ යන දෙකින් වඩා කෙටි කාල සීමාව තුළ මුදලින් උපලබ්ධිවීමට අපේක්ෂිත දේ වන්නේය. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ ශේෂපත්‍ර දිනයේ සිට එක් වසරක කාලසීමාවක් ඉක්මවා රඳවා ගැනීමට සංස්ථාව අදහස් කරන වත්කම් වේ.

3.2.1.1 දේපළ, පිරියත සහ උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි සමන්විත වනුයේ මූලිකවම ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානවලිනි. සියලුම දේපළ, පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැයට ප්‍රකාශ කරනු ලැබ ඇත. දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය යනු අත්කර ගැනීමේ හෝ ඉදිකිරීම් පිරිවැය සමඟින් අපේක්ෂිත පරමාර්ථය සඳහා අදාළ වත්කම වැඩ කරන තත්ත්වයට ගෙන ඒම සඳහා දැරීමට සිදු වන ආනුෂංගික වියදම් ද වේ. වත්කම්වල ඉපැයුම් ධාරිතාව අඛණ්ඩව පවත්වා ගෙනයාම හෝ ඉහළ නැංවීම පිණිස ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. පසුව දරන අනෙකුත් පිරිවැය වත්කමේ ධාරන අගයට ඇතුළත් කරනු ලබන්නේ හෝ වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම අයිතම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් පමණි.

3.2.1.2 ප්‍රතිස්ථාපන පිරිවැය

මුල් අවස්ථාවේදීම කාර්යසාධනය පිළිබඳ අගයන ලද ප්‍රමිතිය මඟින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මඟින් දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ඇති වන අළුත්වැඩියා හෝ නඩත්තුව මත ඇති වන වියදම් වියදම් දරන ලද අවස්ථාවේ දී සිදු වූ වියදමක් ලෙස හඳුනා ගනු ලබයි.

3.2.1.3 ක්ෂයවීම

ඉඩම් ක්ෂය කිරීමක් සිදු නොවේ. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ සියලුම දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තනක්සේරුව මත සරල මාර්ග පදනම යොදා ගනිමිනි. මේ සඳහා යොදා ගත් ප්‍රධාන වාර්ෂික අනුපාත පහත දැක්වෙන පරිදි වේ:

ගොඩනැගිලි	2.5%
පිරියත සහ යන්ත්‍රසූත්‍ර	7.5%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරණ	7.5%
ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ	10%
සම්ප්‍රේෂක	7.5%
මෝටර් රථ වාහන	25%
සංගීත භාණ්ඩ	10%
පරිගණක උපකරණ	50%
තැටි සහ පටි	33.33%
සුළු උපකරණ	50%
මෘදුකාංග	50%

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේ දීම වත්කමේ අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ආයු කාලය උචිත පරිදි සමාලෝචනයකට ලක් කොට ගැලපීම් සිදු කෙරේ.

වත්කමක ධාරන අගය එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි මුදලට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරන අගය වහාම අය කර ගත හැකි මුදලට ලියා ගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කරනු ලබන්නේ ඒවායේ වටිනාකමට සාපේක්ෂව වන අතර මෙහෙයුම් ලාභය නිශ්චය කිරීමේ දී එය සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් අලෙවි කරන විට අනෙකුත් සංචිතවල ඇතුළත් කර ඇති වටිනාකම් රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

3.2.2 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ යන්නෙන් වත්කමක් ඉදිකිරීමකට සෘජුවම ආශ්‍රිත ද්‍රව්‍යමය පිරිවැය සහ අනෙකුත් පිරිවැය නිරූපණය වේ. නොනිමි වැඩ සැලකිය යුතු මට්ටමකට සම්පූර්ණ කරනු ලැබූ විට දී සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් විට දී අදාළ වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

3.2.3 මූල්‍ය වත්කම්

3.2.3.1. වර්ගීකරණය

3.2.3.2 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ සක්‍රීය වෙළඳපොළ මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරණ කාලසීමාව අවසානයේ දී මාස 12කට වඩා වැඩි කල්පිරීම් සඳහා හැරුණු විට, ඒවා ජංගම වත්කම් හි ඇතුළත් කරනු ලැබේ. මේවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාගමේ ණය සහ ලැබිය යුතු දේ ශේෂ පත්‍රයේ "වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ සහ "මුදල් සහ මුදල් සමාන දේ"වලින් සමන්විත වේ. (සටහන් 13 සහ 14)

3.2.5.4. හඳුනා ගැනීම සහ මැනීම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට දැක්වෙන මූල්‍ය වත්කම් ආරම්භයේ දී සාධාරණ වටිනාකමට පිළිගනු ලබන අතර ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හිලව් කොට දක්වනු ලැබේ. ආයෝජනවලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය අවසන් වී ඇති විට දී හෝ හිමිකාරත්වයේ සියලුම අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලැබ ඇති විට දී මූල්‍ය වත්කම් පිළිගැනීම අවසන් කරනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් පසුව සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු දේ පසුව ක්‍රමක්ෂ කරන ලද මිලට දක්වනු ලැබේ.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් කාණ්ඩයේ සාධාරණ වටිනාකමේ වෙනස්වීම්වලින් මතුවන ලාභ හෝ අලාභ ඒවා මතුවන කාලසීමාව තුළ 'අනෙකුත් (අලාභ)/ ලාභ – ශුද්ධ' හි අදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ.

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් සහ මුදල් නොවන සුරැකුම්පත්වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති සුරැකුම්පත් විකුණනු ලබන විට දී හෝ හානි වූ විට දී, ස්කන්ධයේ පිළිගනු ලබන සමුච්චිත සාධාරණ වටිනාකමේ ගැලපීම් 'ආයෝජන සුරැකුම්පත්වලින් ලාභ හෝ අලාභ' ලෙස ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ. සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අලෙවියට තිබෙන සුරැකුම්පත් මත පොලිය අනෙකුත් ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

3.2.5.5 මූල්‍ය වත්කම් හානි

(අ) ක්‍රමක්ෂිත පිරිවැයට දැක්වෙන වත්කම්

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේ දීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි යන්න සංස්ථාව විසින් තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී, හානි අලාභ දැරීමට සිදු වනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදු වන තනි හෝ බොහෝ සිද්ධීන් හි (හානි සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානි සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි ඇත් නම් සහ එම හානි සිද්ධිය (හෝ සිද්ධි) මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තුගත අනුගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මැනිය හැකි බලපෑම් ඇති කරන්නේ නම් පමණි.

ණයගැතියෝ සහ ණයගැති සමූහයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට වන ඇඟවීම්, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රසංවිධානයක් සඳහා එළැඹීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම හා සහ සම්බන්ධ වන නිඟ මුදල් වෙනස්කම් හෝ ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් හි මැනිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම ආදිය හානි පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් විය හැකිය.

ණය සහ ලැබිය යුතු දෑ කාණ්ඩය සඳහා, හානියේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ මුදල සහ මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසයි. ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ වත්කමෙහි ධාරණ මුදල අඩු කර අලාභයේ ප්‍රමාණය පිළිගනු ලැබේ. යම් ණයක හෝ කල් පිරීම දක්වා රඳවා ගත් ආයෝජනයක විචල්‍ය ණය අනුපාතයක් තිබෙන්නේ නම්, කිසියම් හානි අලාභ මැනීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වර්තමානය වන විට ක්‍රියාත්මක පොලී අනුපාතයයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ මිලක් යොදා ගනිමින් සාධනපත්‍රයක සාධාරණ වටිනාකම් පාදකව සංස්ථාව හානිය මැනීමට ඉඩ තිබේ.

පසුව එළැඹෙන කාලසීමාවක දී, හානියෙන් සිදු වූ අලාභයේ ප්‍රමාණය අඩු වී එම අඩුවීම හානි වීම පිළිගැනීමෙන් පසුව සිදු වූ සිද්ධියකට වාස්තවිකව සම්බන්ධ වන්නේ නම්, (ණයහිමියාගේ ණය ප්‍රමාණ කිරීම වැඩි දියුණුවීමක් වැනි) කලින් පිළිගත් හානි වීමේ අලාභයක් ප්‍රතිවර්තනය ආදායම් ප්‍රකාශනයෙහි පිළිගනු ලැබේ.

3.2.5.6 වෙළඳ ලැබිය යුතු දේ

වෙළඳ ලැබිය යුතු දේ අපේක්ෂිත උපලබ්ධි කළ හැකි වටිනාකමට දක්වනු ලැබේ. ලැබිය යුතු දේ පිළිබඳ මුල් නියමයන් ප්‍රකාරව අයවිය යුතු සියලු මුදල් ප්‍රමාණ සංස්ථාවට එකතු කර ගැනීමට නොහැකි විය හැකි බවට වාස්තවික සාක්ෂි ඇති විට දී වෙළඳ අයවිය යුතු දේවල්වල හානිවීම් සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපනය කෙරේ. ණයගැතියා මුහුණ දෙන සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බුන්වත් භාවයට පත්වීම හෝ මූල්‍ය ප්‍රතිසංවිධානය සඳහා ඇති ඉඩකඩ ආදිය වෙළඳ ලැබිය යුතු දේ දුර්වල වී ඇති බවට දර්ශකයක් වශයෙන් සලකනු ලැබේ. දීමනා ගිණුමක් භාවිතා කිරීමෙන් වත්කමේ ධාරණ වියදම අඩු කරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ බෙදාහැරීමේ පිරිවැය තුළ පාඩු මුදල් සහ දීමනා ගිණුමෙන් එය කපා හරිනු ලැබේ. කලින් කපා හරින ලද මුදල් පසුව එකතු කර ගැනීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ බෙදාහැරීමේ පිරිවැයට බාර කරනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දේ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් පසුව ඒවා හානිවීම සහ වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සළුල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට මනිනු ලැබේ.

3.2.6 ඉන්වෙන්ට්‍රිගත කළ තොග

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි කළ අගයට වේ. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් අඩු කිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලයි.

3.2.7 මුදල් සහ මුදල්වලට සමාන දේ

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනයේ මුදල් සහ මුදල්වලට සමාන දේ යන්නට අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවක් ඇති ආයෝජන සහ බැංකු අයිරා අයත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බැංකු අයිරා පෙන්වා දෙනු ලබන්නේ ජංගම වගකීම් තුළ ණයගැනුම් ලෙසයි.

3.2.8 ණයගැනුම් පිරිවැය

අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සූදානම් කිරීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගන්නා වත්කම් ලෙස සුදුසුකම් ලබන වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය වෙත සෘජුවම ආරෝපණය සාමාන්‍ය හෝ නිශ්චිත ණය ගැනුම් පිරිවැය, එකී වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතාවට හෝ විකිණීමට සාරානුකූලව සුදානම් කරන කාලය තෙක් එම වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ.

නිශ්චිත ණයගැනුම්වල තාවකාලික ආයෝජන මත උපයනු ලැබූ ආයෝජන ආදායම, සුදුසුකම් ලබන වත්කම මත ඒවායේ වියදම තීරණය කරන තෙක් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ඇති ණයගැනුම් පිරිවැයෙන් අඩු කරනු ලැබේ.

අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලසීමාව තුළ ලාභ හෝ අලාභයන් හි පිළිගනු ලැබේ.

3.2.9 ජංගම සහ විලම්භිත බදු

අදාළ කාලසීමාව සඳහා බදු වියදම ජංගම සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. ආදායම් ප්‍රකාශය තුළ බදු පිළිගනු ලබන්නේ අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හෝ සෘජුවම කොටස්වල ගණන් ගනු ලබන අයිතමවලට ඒවා අදාළ වන ප්‍රමාණයට හැර ඉතිරි ප්‍රමාණයටයි. උක්ත කී ආකාරයට අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හෝ සෘජුවම කොටස්වල ද බදු ගණන් ගැනේ.

අ) ජංගම බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනවල විධිවිධාන අනුව සංස්ථාවට ජංගම බදු බැරකම් ඇති වේ. සැබෑ බැරකම් පිළිබිඹු කරන්නක් වශයෙන් කළමනාකාරීත්වය විශ්වාස කරන යථෝක්ත ප්‍රතිපාදන යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල මෙම බැරකම් සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ. ගනුදෙනු පිළිබඳව සංස්ථාව විසින් ගනු ලැබූ ස්ථාවරය ආදායම් අධිකාරීන් විසින් අභියෝගයට ලක් කරන අවස්ථා තිබිය හැකිය. මෙම කරුණු හේතුවෙන් ඇති වන කවර හෝ අතිරේක පිරිවැයක් සංස්ථාව මත බැරකම තහවුරු කරන අවස්ථාවේ බදු වියදමක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

සලකා බලන වර්ෂය සහ කාලසීමාවන් සඳහා ජංගම බදු වත්කම් සහ බැරකම් මනිනු ලබන්නේ ආදායම් අධිකාරියට ආපසු අය කර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණවලිනි. ප්‍රමාණය ගණනය කිරීම පිණිස භාවිතා කළ බදු අනුපාත හෝ බදු නීති වනුයේ ශේෂපත්‍ර දිනය වන විට පනවනු ලබන හෝ සැලකිය යුතු ලෙස පනවනු ලබන ඒවා වේ. ජංගම බදු සඳහා ප්‍රතිපාදන පදනම් වනුයේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් සහ වියදම් අංග පදනම් කර ගනිමිනි.

ආ) විලම්භිත බදු

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්භිත බදු හඳුනාගනී. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු අය කළ හැකි ලාභයට බලනොපාන ගනුදෙනුවක දී වත්කම් සහ බැරකම් ආරම්භක පිළිගැනීමෙන් මතුවන තාවකාලික වෙනස්කම් සහ පුර්ව අපේක්ෂිත අනාගතයේ ප්‍රවර්තනය නොවීමට ඉඩ ඇති ප්‍රමාණයට ආයෝජන ආශ්‍රිත වෙනස්කම් සඳහා විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. ඊට අමතරව, කීර්ති නාමය ආරම්භක පිළිගැනීම මත මතුවන බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා ද විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. වාර්තාකරණ දිනය වන විට පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පැනවීමට ඉඩ ඇති නීති මත පදනම්ව තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය වන විට දී යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයන්ට විලම්භිත බදු ගණනය කෙරේ. ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අය කළ හැකි අස්ථිත්වයට එහි බදු අධිකාරීන් විසින්ම අය කරනු ලබන ආදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් උපයෝජනය සඳහා යොදා ගත හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ඇති විය හැකි තාක් දුරට පමණි. එක් එක් වාර්තාකරණ දිනයට විලම්භිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ උපලබ්ධිවීම තවදුරටත් සිදු නොවිය හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

3.2.10 සේවක ප්‍රතිලාභ

3.2.10.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම – විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැසුමක් හැරුණු කොට පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව මූල්‍ය

ප්‍රකාශනයේ පිළිගනු ලබන බැරකම වාර්තාකරණ දිනයට නිශ්චිත බැඳීමේ වත්කම් වටිනාකමයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකම් නිශ්චය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා යාම වට්ටම් කිරීම මඟිනි.

ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයන් හි සහ ආශ්‍රිත බැරකමේ කාලසීමාවන්ට සමීප වන්නාවූ කල්පිරීමේ කාල සීමා සහිත පොලී අනුපාත භාවිතා කරමින් ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 (2006 දී සංශෝධිත) අනුකූල වන පරිදි සියලුම ස්ථීර සේවකයින් සඳහා සේවයේ පළමු වසර සම්පූර්ණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේවුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමඟ සේවකයෙකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේ දී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයා ගනු නොලැබේ. කළමනාකාරීත්වය විසින් සලකා බලනු ලබන ආයු ගණකයේ ප්‍රධාන උපකල්පනයන්ට පහත දේ ඇතුළත් වේ:

01. 7.79.% ක පොලී අනුපාතය

02. 1.5% ක වැටුප් වර්ධක අනුපාතය

03. සියලුම සේවකයින්ගේ විශ්‍රාම යනු ලබන වයස අවුරුදු 60 කි.

04. කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය 2% කි.

ආ) නිශ්චිත දායක සැලසුම් – "සේවක අර්ථසාධක අරමුදල" සහ "සේවානියුක්තිකයින්ගේ භාර අරමුදල"

"සේවක අර්ථසාධක අරමුදලේ" දායකත්වය සහ "සේවානියුක්තිකයින්ගේ භාර අරමුදලේ" දායකත්වයට හිමිකම් ලබන සියලුම සේවකයින් අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිශ්චිත දායක සැලසුම් සඳහා මුදල් දරන ලද අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

3.2.11 රජයේ ප්‍රදාන

ප්‍රදානයට අදාළ කොන්දේසිවලට සංස්ථාව අනුකූල වන බවට සහ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් තිබෙන්නේ නම් රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට පිළිගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර හානි පූර්ණය කිරීමට අපේක්ෂා කරනු ලබන පිරිවැය සමඟ ඒවා ගැලපීම පිණිස අවශ්‍ය කාල සීමාව මුළුල්ලේම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවලට අදාළ රජයේ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස ජංගම නොවන වගකීම්වලට ඇතුළත් කරනු ලබන අතර ආශ්‍රිත වත්කම්වල අපේක්ෂිත ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

ක්‍රමක්ෂ අනුපාත පහත දක්වා ඇත.

ගොඩනැගිලි	2.5%
පිරියත සහ යන්ත්‍රසූත්‍ර	7.5%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරණ	7.5%
ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ	10%
සම්ප්‍රේෂක	7.5%
මෝටර් වාහන	25%
පරිගණක උපකරණ	50%
. මෘදුකාංග	50%

3.2.12 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් සංස්ථාව සතුව ඇති විට එකී බැඳීම් පියවනු වස් ආර්ථික ප්‍රතිලාභ හුවා දක්වමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වන විටක දී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි වන විට ප්‍රතිපාදන හඳුනා ගනී.

3.2.13 අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්

අසම්භාව්‍ය බැරකමක් යනු සංස්ථාවේ පාලනයෙන් බැහැර වන අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් ක්‍රියාත්මක වීම හෝ ක්‍රියාත්මක නොවීම මඟින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් හෝ එකී බැඳීම්වලින් නිදහස්වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීමේ ශක්‍යතාවක් නොමැති බැවින් නොපිළිගැනෙන වර්තමාන බැඳීමකින් හෝ උද්ගතවීමට හැකියාවක් ඇති බැඳීමකි. විශ්වාසනීය ලෙස මැනිය නොහැකි බැරකමක් පවතින බෙහෙවින් දුරලඟ අවස්ථාවන්හි දී ද බැරකමක් හඳුනා නොගන්නා නමුත් එවැන්නක පැවැත්ම මූල්‍ය ප්‍රකාශවලින් අනාවරණය කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම්වලින් පැන නැඟිය හැකි වැඩි සංඛ්‍යාවක් ඇතිවීමකින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් පැන නැඟීමට ඉඩ ඇති වත්කමකි. සංස්ථාව අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ඇතුළට ගලා ඒම් සිදුවිය හැකි වුවත් එය සැබවින්ම ස්ථිර නොවන අවස්ථාවල දී එවැනි දේවල්වල පැවැත්ම අනාවරණය කරයි.

3.2.14 වෙළඳ ගෙවිය යුතු දේ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා ලද භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බැඳීම් වේ. ගෙවීම් කළ යුතු වන්නේ වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ නම් (හෝ ඊට වඩා කාලය දිගු වන්නේ නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍ර තුළ දී) ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

වෙළඳ ගෙවිය යුතු දේ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් අනතුරුව සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට මනිනු ලැබේ.

3.2.15 මූල්‍ය කල්බදු බැඳීම්

කල්බදු ගත් අයිතමවල හිමිකමට ආනුශංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සංස්ථාවට පවරන්නා වූ මූල්‍ය කල්බදු මත ලබාගත් දේපළ, පිරියත සහ උපකරණ අදාළ කල්බදු ආරම්භයේ දී කල්බදු ගත් දේපළේ සාධාරණ වටිනාකමට

හෝ වඩා අඩු නම් සමුච්චිත ක්ෂයවීම් අඩු කොට ආරම්භයේ දී අවම කල්බදු ගෙවීමේ වටිනාකමේ වර්තමාන අගයට ප්‍රාග්ධනිත කරනු ලැබේ.

ගෙවිය යුතු මුළු පොලිය අවිනිශ්චිත පොලියක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ. අනුරූපී ණය බදුදීමනාකරුට ගෙවිය යුතු ණය මුදලක් ලෙස වාර්තා කරනු ලැබේ. ගෙවන ලද වාරික බැරකම අඩු කිරීම සඳහා යොදා ගනු ලැබේ.

වර්ෂයට අය කරන පොලිය පොලී සඳහා වන අවිනිශ්චිත ගිණුමෙන් ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

3.2.16 ආදායම් ප්‍රකාශනය

3.2.16.1 ආදායම පිළිගැනීම

ලැබුනු හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවේ සාධාරණ වටිනාකමට අනුව ආදායම ගණනය කිරීම සිදු කරනු ලබන අතර සපයන ලද සේවා වෙනුවෙන් ලැබිය යුතු මුදල් ප්‍රමාණ පෙන්නුම් කරන අතර වට්ටම් සහ වටිනාකම එකතු කළ බදු අඩු කොට සඳහන් කරනු ලැබේ. ආදායම් ප්‍රමාණ විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි විට දී අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ප්‍රවාහය වීමට ප්‍රස්ථාව ඇති විට දී සහ සංස්ථාවේ එක් එක් ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත නිර්ණායක සපුරා ඇති විට දී සංස්ථාව ආදායම පිළිගනී. පහත විස්තර කර ඇති පරිදි ගනුදෙනුකරුගේ ස්වරූපය, ගනුදෙනු වර්ගය සහ එක් එක් සැකැස්මේ නිශ්චිත තොරතුරු සැලකිල්ලට ගනිමින් සංස්ථාව සිය ප්‍රතිලාභ ඇස්තමේන්තු ඓතිහාසික ප්‍රතිඵල මත පදනම් කර ගනී.

(අ) ගුවන් කාල අලෙවි කිරීම

ගුවන් කාලය අලෙවියෙන් ලැබෙන මුදලින් ආදායම සමන්විත වේ. වෙළඳ දැන්වීම් ප්‍රචාරය වන ගුවන් කාලය විකිණීමෙන් ලැබෙන ආදායම මෙසේ පිළිගනු ලැබේ.

(ආ) පොලී ආදායම

එකතු කර ගැනීමට හැකි බව පිළිබඳව සැකයක් ඇත්තේ නම් මිස කාල පදනමින් උපචිත වූ පොලිය (වත්කමේ සඵල ඵලදාව සැලකිල්ලට ගනිමින්) පොලී ආදායම ලෙස පිළිගනු ලැබේ.

(ඇ) දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලැබීම් සහ අලාභ

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ශුද්ධ ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් මුදල් දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ වටිනාකම සැසඳීමෙන් වන අතර ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ඈ) වෙනත් ආදායම

අනෙක් සියලුම ආදායම් පිළිගනු ලබන්නේ උපචිත පදනම මත වේ.

3.2.17.1 වියදම් පිළිගැනීම

අ) මෙහෙයුම් වියදම්

ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර සෘජු සබඳතා පදනම මත වේ. ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ දී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුළ දේපළ, පිරියත සහ උපකරණ

නඩත්තු කිරීමේ දී දරනු ලබන සියලුම වියදම් වර්ෂයේ ලාභ / (අලාභ) නිගමනය කිරීමේ දී ආදායමෙන් අඩු කරනු ලැබ ඇත. බොල් සහ අඩමාන ණය, දන්නා සියලුම බැරකම් සහ දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂයවීම් සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

ආ) **මූල්‍ය වියදම්**

පොලී වියදම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ. ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලසීමාවේ දී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

3.2.18 තුලනාත්මක සංඛ්‍යා

අවශ්‍ය අවස්ථාවල දී ප්‍රවර්ථන වර්ෂය තුළ දී කරනු ලබන ඉදිරිපත් කිරීම්වලට අනුකූල වනු පිණිස තුලනාත්මක සංඛ්‍යා ගලපනු ලැබ ඇත.

4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තාකර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරීත්වයට සිදු වේ. කෙසේවුව ද මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතභාවය, අනාගත කාල සීමාවන් හි සිදු කරනු ලබන වත්කම් හෝ බැරකම්වල ධාරණ වටිනාකමට ද්‍රව්‍යමය වෙනස්කම් අවශ්‍ය කරන්නා වූ ප්‍රතිඵල ඇති කිරීමට හැකිය.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් පහසුවෙන් හඳුනා ගත නොහැකි වත්කම්, බැරකම් සහ අසම්භාව්‍ය බැරකම්වල ධාරණ ප්‍රමාණ සම්බන්ධයෙන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමේ දී පදනම සකස් කරන්නා වූ අවස්ථානුකූල තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරනු ලබන අනෙකුත් විවිධ සාධකවල ප්‍රතිඵල මත පදනම් වී ඇත.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, එකී ප්‍රතිශෝධන වර්තමාන සහ අනාගත කාල සීමාවන් සඳහා බලපාන්නේ නම් එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාලසීමාවේ දී පිළිගනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිතා කිරීමේ දී කළමනාකාරීත්වය විසින් සිදු කරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

(අ) විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයු ගණක පදනමක් මත නිර්ණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) නිශ්චය කිරීමේ දී යොදා ගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය ඇතුළත් වේ. මෙම උපකල්පනවල කවර හෝ වෙනසක් විශ්‍රාම වැටුප් බැඳීම්වල ධාරණ මුදල් ප්‍රමාණය කෙරෙහි බලපානු ඇත.

යෝග්‍ය වට්ටම් අනුපාතය සෑම වසරක් අවසානයේ දීම සංස්ථාව මඟින් නිශ්චය කරනු ලැබේ. විශ්‍රාම වැටුප් බැඳීම් පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලබන අනාගත මුදල් ගලායාම්වල වර්තමාන වටිනාකම නිශ්චය කිරීම සඳහා භාවිතා කළ යුතු පොලී අනුපාතය වන්නේ මෙයයි. යෝග්‍ය වට්ටම් අනුපාතය නිශ්චය කිරීමේ දී සංස්ථාව ආයතනික බැරකම්වල පොලී අනුපාත සැලකිල්ලට ගනී. විශ්‍රාම වැටුප් බැඳීම් අනෙකුත් ප්‍රධාන උපකල්පන වත්මන් වෙළඳපොළ තත්ත්වයන් මත ද අර්ධ වශයෙන් පාදක වේ.

(ආ) ආදායම් බදු

සංස්ථාව ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය නිශ්චය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ. බොහෝ ගනුදෙනු සහ ගණනය කිරීම් ඇති අතර ඒ සඳහා අවසාන බදු නිශ්චය කිරීම අවිනිශ්චිතය. අතිරේක බදු ලැබීමට නියමිත ද යන්න පිළිබඳ ඇස්තමේන්තු මත පාදකව අපේක්ෂිත බදු විගණන ගැටළු සඳහා සංස්ථාව බැරකම් පිළිගනු ලැබේ. මෙම කරුණුවල අවසාන බදු ප්‍රතිඵලය ආරම්භයේ දී වාර්තා කළ ප්‍රමාණයන්ට වඩා වෙනස්වන විට දී එම වෙනස්කම් එවැනි නිශ්චය කිරීම් සිදු කරනු ලැබූ කාල සීමාව තුළ ජංගම සහ විලම්භිත ආදායම් බදු වත්කම් සහ බැරකම් කෙරෙහි බලපානු ඇත.

5. මූල්‍ය අවදානම් කළමනාකරණය

5.1 මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් එම ආයතනය විවිධමූල්‍ය අවදානම්වලට නිරාවරණය කරයි: (ව්‍යවහාර මුදල් අවදානම, සාධාරණ වටිනාකම පොලී අනුපාත අවදානම, මුදල් ප්‍රවාහ පොලී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළු) වෙළඳපොළ අවදානම, ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම මෙම අවදානම් වේ. සංස්ථාවේ සමස්ත ණය කළමනාකරණ වැඩසටහන් සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය මත අහිතකර බලපෑම් ඇති කළ හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඉලක්කගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවදානම් කළමනාකරණය සිදු කරනු ලබයි.

අ) වෙළඳපොළ අවදානම්

(i) විදේශ විනිමය අවදානම

සංස්ථාව විසින් තමන්ට අවශ්‍ය උපකරණ ජාත්‍යන්තරව ආනයනය කරන අතර මූලිකව ඇමෙරිකානු ඩොලරයේ වටිනාකමට අදාළව ව්‍යවහාර මුදල් නිරාවරණය මඟින් මතුවන විදේශ විනිමය අවදානම්වලට නිරාවරණය වේ. අනාගත වාණිජ ගනුදෙනුවලින් සහ පිළිගත් වත්කම් සහ බැරකම්වලින් මතු වන සිය විදේශ විනිමය අවදානම් කළමනාකරණය කිරීම පිණිස සමාගම දේශීය නියෝජිතයින් සමඟ ගිවිසුම්වලට එළැඹේ.

(ii) මිල අවදානම

වෙළඳ භාණ්ඩ මිල අවදානමට සංස්ථාව නිරාවරණය වේ. ප්‍රධාන සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළැඹීම මඟින් සංස්ථාව අවදානම් අවම කරයි.

iii) ණය අවදානම්

ණය අවදානමට නිරාවරණය වනුයේ මූලිකවම වෙළඳ ලැබිය යුතු දේ වලින් වන අතර සේවා සැපයීමට පෙර සිය නව ගනුදෙනුකරුවන් සෑම කෙනෙක් සඳහාම ණය අවදානම කළමනාකරණය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ වගකීම සංස්ථාව සතුය.

ණය අවදානම මතු වනුයේ මුදල් සහ මුදල්වලට සමාන දේ, බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ලැබිය යුතු දේ සහ වාණිජ ගනුදෙනු වෙත නිරාවරණය විම් මඟිනි. බැංකු සහ මූල්‍ය ආයතන

සඳහා ස්වායීනව ශ්‍රේණිගත කරනු ලැබූ අවම වශයෙන් 'ඒ' ශ්‍රේණිගත කිරීම සහිත පාර්ශ්ව පමණක් පිළිගනු ලැබේ. අවදානම් පාලනය ගනුදෙනුකරුගේ මූල්‍ය තත්ත්වය, අතීත අත්දැකීම් සහ අනෙකුත් සාධක සැලකිල්ලට ගනිමින් ණය ගුණාත්මය තක්සේරු කරනු ලැබේ. අභ්‍යන්තර හෝ බාහිර ශ්‍රේණිගත කිරීම් මත පාදකව කේවල ණය සීමා පනවනු ලැබේ. ණය සීමා උපයෝජනය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ.

iv) ද්‍රවශීලතා අවදානම්

සංස්ථාව විසින් මූල්‍ය ප්‍රවාහ පූරෝකථනය සිදු කරනු ලබන අතර සංස්ථාවේ ද්‍රවශීලතා අවශ්‍යතා සහතික කිරීම පිණිස නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. එබඳු පුරෝකථනවල දී සංස්ථාවේ ණය මූල්‍යකරණ සැලසුම්, ප්‍රඥප්ති අනුකූලතාව සැලකිල්ලට ගනු ලැබේ. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය කරනු ලබන ශේෂයට වඩා සහ ඉහළින් සංස්ථාව විසින් රඳවා ගෙන ඇති අතිරික්ත මුදල්, බැඳීම් සපුරාලීම සඳහා යෝග්‍ය කල් පිරීම් සහිත පොලී ආදායම් උපයනු පිණිස කාල තැන්පතුවලට මාරු කරනු ලැබේ.

6. ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

සබඳතාවේ නම	තනතුර	ගනුදෙනුවේ ස්වභාවය	කාලසීමාව
රමණී ගුණවර්ධන මිය	**සභාපති (වැඩබලන)**	**නැත**	01.01.2020-13.01.2020
ඩබ්ලිව්. ඒ. චූලානන්ද පෙරේරා මහතා	**සභාපති (වැඩබලන)**	**නැත**	15.01.2020-29.01.2020
රෝහණදේව පෙරේරා මහතා	**සභාපති**	**නැත**	29.01.2020 (01 day)
ජගත් චික්‍රමසිංහ මහතා	**සභාපති**	**නැත**	11.02.2020–31.12.2020
ජී.එම්.ජේ.කේ. ගුණවර්ධන මහතා	**භාණ්ඩාගාර සාමාජික**	**නැත**	17.01.2020-31.12.2020
සංජීවනී වීරසිංහ මිය	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**නැත**	29.01.2020-
ගාමිණී විජේවර්ධන මහතා	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**නැත**	29.01.2020-31.12.2020

සබඳතාවේ නම	තනතුර	ගනුදෙනුවේ ස්වභාවය	කාලසීමාව
සිසිර මුණසිංහ මහතා	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**නැත**	29.01.2020-31.12.2020
එච්.ජී.එස්.ආර්. සෝමසිරි මහතා	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**නැත**	05.10.2020-31.12.2020
එන්.එස්.පී. වාහලතන්ත්‍රිගේ මහතා	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**නැත**	26.11.2020-31.12.2020

1 සටහන

ආදායම

විස්තරය	2020	2019
ආසියානු සේවයේ ගුවන් කාලය අලෙවිය	8,070,458	11,624,771
ගුවන් කාලය අලෙවිය T.W.R.	97,178,959	100,269,279
ගුවන් කාලය අලෙවිය ප්‍රාදේශීය සේවය	325,394,614	410,261,182
නිෂ්පාදන ගාස්තු- ප්‍රාදේශීය සේවය	5,503,824	7,206,618
ආදායම ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය	102,146,029	124,223,056
මරණ දැන්වීම්	1,522,215	2,528,651
ගුවන් කාලය අලෙවිය FEBA	5,274,763	3,743,512
	545,090,863	**659,857,071**

2 වැනි සටහන

විකුණුම් පිරිවැය

විස්තරය	2020	2019
වැටුප්, වේතන සහ දීමනා	273,815,167	317,246,928
සේවක අර්ථසාධක අරමුදල	35,844,738	41,772,811
සේවක භාරකාර අරමුදල	6,698,158	8,140,260
ප්‍රවාහනය හා යැපුම් දීමනා	1,434,142	3,353,708
වැඩසටහන් ගාස්තු	3,961,000	3,066,756
සහන පදනම් මත සේවය කළ කාර්ය මණ්ඩලය	5,874,748	7,234,534
වාහන කුලී ගාස්තු	6,870,037	10,188,903
නඩත්තු පිරිවැය	4,339,134	13,446,919
සම්බන්ධ කිරීමේ ගාස්තු	3,678,032	4,741,698
පිටත කුළුණු සඳහා කුලිය	6,762,828	5,305,843
විදුලිය	149,259,683	170,572,953
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	1,212,878	2,570,187
ගුවන් කාලය විකිණීමේ කොමිස් මුදල (දේශීය)	36,824,755	56,240,697
ගුවන් කාලය විකිණීමේ කොමිස් මුදල (විදේශීය)	1,033,268	750,658
	537,608,568	**644,632,855**

3 සටහන

වෙනත් මෙහෙයුම් ආදායම

විස්තරය	2020	2019
ණය මත පෙලිය	9,379,335	11,453,664
විවිධ ආදායම (වෙනත්)	51,157,051	63,551,858
ආපසු හරවා එවූ චෙක්පත් සඳහා ප්‍රචාරණ නියෝජිතයින්ගෙන් දඩ	2,053	17,429
නිවාස කුලී	194,426	198,892
සංචාරක බංගලාවලින් ආදායම	236,636	749,569
විශේෂ පටිගත කිරීම්	281,204	981,923
ආනයනකරුවන්, වෙළෙන්දන් සඳහා බලපත්‍රදීම	6,044,630	7,240,708
කැසට්පට අලෙවිය	1,473,624	2,406,604
දඩ ගිණුම්	94,076	12,470
සංචාරක බංගලාවලින් ආදායම-අඹේවෙල	136,465	363,813
ප්‍රකාශන අලෙවිය	46,018	35,911
උප-එකතුව	**69,045,519**	**87,012,842**
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	121,987,376	107,878,577
ත්‍රිකුණාමලය ප්‍රදානය ක්‍රමක්ෂය	155,406,674	155,406,674
උප-එකතුව	**277,394,050**	**263,285,251**
මුළු එකතුව	**346,439,569**	**350,298,093**

3.1 සටහන

රජයේ ප්‍රදාන

විස්තරය	2020	2019
බලපත්‍ර ගාස්තු සඳහා රජයේ ප්‍රදාන	440,000,000	**365,000,000**
	440,000,000	**365,000,000**

බලපත්‍ර

04 සටහන

බෙදාහැරීමේ පිරිවැය

විස්තරය	2020	2019
බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන්කිරීම	5,027,070	
වැඩසටහන් වියදම් (ක්‍රිකට් හා කලාකරුවන්)	1,404,000	
	6,431,070	**-**

5 සටහන

වෙනත් මෙහෙයුම් වියදම්

විස්තරය	2020	2019 ගලපන ලද	ගැලපුම	2019 අනුමත
බාහිර විකාශන ආයතන වෙත දායකත්වය	985,265	961,662		961,662
ප්‍රවෘත්ති සේවාව හා ප්‍රවෘත්ති සාරාංශ	215,225	687,580		687,580
වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණය	114,698	1,100,095		1,100,095
විදුලිය හා බලශක්තිය	17,669,098	9,780,037		9,780,037
තැපැල් ගාස්තු හා දුරකථන ගාස්තු	12,905,230	12,527,041		12,527,041
මුද්‍රණ කටයුතු හා ලිපිද්‍රව්‍ය	3,834,716	5,032,219		5,032,219
මෝටර් රථ ධාවන වියදම්	11,948,043	14,116,817		14,116,817
විකාශන උපකරණ අළුත්වැඩියා හා නඩත්තු	17,804,304	22,807,521		22,807,521
සංගීත උපකරණ අළුත්වැඩියාව හා නඩත්තු	35,000	153,200		153,200
ගෘහභාණ්ඩ තිරවුරු හා සවිකිරීම් අළුත්වැඩියාව හා නඩත්තුව	4,145,812	3,141,044		3,141,044
ගොඩනැගිල්ල හා ගෙවත්ත අළුත්වැඩියාව හා නඩත්තුව	6,961,806	10,029,460		10,029,460
ක්ෂයවීම්	113,424,212	97,560,264	67,864	97,492,400
ක්ෂයවීම් ත්‍රිකුණාමලය	161,429,772	160,138,994	(1,086,000)	161,224,994
මෘදුකාංග ක්‍රමක්ෂය	6,506,193	3,799,194	886,166	2,913,028
කැසට්පට වියදම	1,575,001	384,606		384,606
බදුකරණය (ESC)		3,669,880		3,669,880
NBT වියදම්	-	8,485,739		8,485,739
මෝටර් රථ කුලී ගාස්තු	4,768,067	929,807		929,807
මුද්දර ගාස්තු	23,644	112,700		112,700
පාඨමාලා ගාස්තු වියදම්	1,360,088	-		
ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු	5,562,900	3,881,020		3,881,020
	371,269,073	**359,298,881**	**(131,970)**	**359,430,850**

06 සටහන

පරිපාලන වියදම්

විස්තරය	**2020**	2019 ගලපන ලද	ගැලපුම	**2019** අනුමත
දීමනාව - සංස්ථාවේ සභාපති සහ සංස්ථා සාමාජිකයින්	1,525,610	1,921,878		1,921,878
වැටුප් චෙතන හා දීමනා	203,136,695	145,783,069		145,783,069
විශේෂ දිරිදීමනා	-	15,952,650		15,952,650
සේවක අර්ථසාධක අරමුදල	36,766,071	30,971,737	(3,732,908)	34,704,645
සේවක භාරකාර අරමුදල	7,903,460	6,457,763		6,457,763
කාර්ය මණ්ඩලය සඳහා අතිකාල දීමනා	39,268,908	37,682,813		37,682,813
සහන පදනම මත සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලය	16,229,545	17,738,776		17,738,776
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා චේතන	49,070,315	56,134,503		56,134,503
කාර්ය මණ්ඩල ප්‍රවාහන ගාස්තු (දේශීය)		95,000		95,000
ප්‍රවාහන හා යැපුම් දීමනා -(විදේශීය හා දේශීය)	556,145	989,351		989,351
නිවාඩු දින වැටුප්	3,009,004	4,068,769		4,068,769
පාරිතෝෂිකය	29,670,376	30,471,666		30,471,666
සභාපතිවරයා කළ සංග්‍රහ දීමනා	322,057	237,294		237,294
අධ්‍යක්ෂ ජනරාල්වරයා කළ සංග්‍රහ දීමනා	65,076	102,327		102,327
සුභසාධනය	4,107,953	2,684,990		2,684,990
වෛද්‍ය සේවාව	45,060	108,893		108,893
පොදු වියදම්	1,122,960	1,919,044		1,919,044
පුද්ගලික ආරක්ෂක සේවාව	8,300,000	10,050,700		10,050,700
කුලී වරිපනම් හා බදු	16,154,052	16,278,460		16,278,460
රක්ෂණය	4,651,321	4,955,384		4,955,384
විගණන ගාස්තු	1,428,000	5,040,000		5,040,000
නෛතික ගාස්තු	615,487	1,473,920		1,473,920
ප්‍රකාශන හා වාරසඟරා	408,090	846,603		846,603
පාරිතෝෂිකය, නඩු හා වෙනත් කටයුතු සඳහා දඩ	8,112	690,006		690,006
	424,364,297	**392,655,593**	**(3,732,908)**	**396,388,501**

6.1) සංස්ථාව විසින් 2020 වර්ෂය සඳහා රු. 473,040.00ක වන පරිදි කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ මරණ දැන්වීම් විකාශනය කිරීම සම්බන්ධයෙන් වියදමක් දරා ඇත. මෙය සෑම වසරකම සංස්ථාව විසින් අනුගමනය කරන පිළිවෙත වේ. මෙය සෑම වර්ෂයකම සංස්ථාව විසින් සිදු කරනු ලබන කටයුත්තකි.

6.2) 2017 දෙසැම්බර් මස 31වැනි දින වන විට රු. 122,356,000ක මුදලක් ගෙවන ලෙසට සංස්ථාවට දන්වා ඇත. රාජ්‍ය ආයතනවල අයත් ඉඩම්. 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන.

තීන්දු ලබා දීමට නියමිතව පවතින නඩු – 2020

ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතී. එම නඩු කටයුතුවල තත්ත්වය පහත දැක්වෙන පරිදි වේ: එය දිස්ත්‍රික් අධිකරණ නඩු අංක 23089/MR දරන නඩුවෙන් දී ඇති විනිශ්චය ඉවතලීම සඳහා සංස්ථාව විසින් ගොනු කර ඇති අභියාචනයකි. එය දිසා අධිකරණයේ පැමිණිලි පාර්ශ්වය විසින් රු. 10,000,000/-ක නෛතික වන්දියක් ගෙවීම සම්බන්ධයෙන් අදාළ වූවකි. නඩු කටයුතු තුනක් අභියාචනාධිකරණයේ විභාග වෙමින් ඇත. මෙය ද සංස්ථාව විසින් ගොනු කරන ලද නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 64296 යටතේ ගොනු කර ඇති මහේස්ත්‍රාත් අධිකරණය මඟින් නිකුත් කළ තීණ්දුව ඉවතලීම සඳහා කරන ලද අභියාචනයකි.

මහාධිකරණයේ නඩු කටයුතු දෙකක් විභාග වෙමින් ඇත. දිසා අධිකරණයේ විනිශ්චය සඳහා වන නඩු පහක් වන අතර එම නඩු කටයුතු දෙකේ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

එක් නඩුවකින් මිලියන 8 + පොලිය සහ අනෙකුත් ඉල්ලීම් රු. 5,917,275/- + පොලිය සහ 10%ක කොමිස් මුදලක් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 26,775කින් අය කිරීම සඳහා වේ. එක් නඩුවක් කම්කරු විනිශ්චය සභාවෙහි පැවති අතර එය විසඳුනි.

මහේස්ත්‍රාත් අධිකරණයේ පොරොත්තුව පවත්නා නඩු 6ක් වන අතර කම්කරු දෙපාර්තමේන්තුවේ විභාග වෙමින් පවතින නඩුකර දෙකකි. බෙරුම්කරණ දෙපාර්තමේන්තුව රු. 11,783,507.20 (10,000,000 + 1,783,507.20) ක් ලෙස මුදල් ප්‍රකාශවල ප්‍රතිපාදන දක්වා ඇත.

07 සටහන

මූල්‍ය පිරිවැය

විස්තරය	2020	2019
බැංකු ගාස්තු	447,513	484,339
අයිරා පොලිය	5,265,923	3,524,150
විනිමය ලාභය/(පාඩු)	213,424	
ණයවරපත් සඳහා කොමිස් මුදල	57,317	64,917
	5,984,176	**4,073,406**

08 සටහන

8 (i) ආදායම් බදු

	2020	2019
ගිණුම් අනුව ශුද්ධ ලාභය/ අලාභය	(454,126,752)	(390,505,571)
එකතු කිරීම		
ක්ෂයවීම		
ක්ෂයවීම ත්‍රිකුණාමලය	113,424,212	97,492,400
බොල් ණය සඳහා ප්‍රතිපාදන	161,429,772	161,224,994
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	5,027,070	-
දඩය	29,670,376	30,471,666
සත්කාරක සේවා	8,112	690,006
ආර්ථික සේවා ගාස්තු	387,133	339,621
	-	3,669,880
	309,946,676	**293,888,566**
අඩු කිරීම		
ඉඩදිය හැකි වියදම්		
ප්‍රාග්ධන දීමනාව	128,804,143	103,071,767
කල්බදු වාරිකය	45,998,508	
කල්බදු වාරික ගැලපීම (2019)	41,206,889	52,934,662
පාරිතෝෂික ගෙවීම	216,009,540	**156,006,429**
බදු අය කළ හැකි ලාභය/(පාඩුව)	(360,189,616)	(252,623,435)
ඉදිරියට ගෙන ආ මුළු බදු පාඩුව	(4,329,563,196)	(4,076,939,762)
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන	**(4,689,752,812)**	**(4,329,563,196)**

ආදායම් තුළින් ලබා ගන්නා ලාභය මත 28%ක අනුපාතිකයකින් ආදායම් බදු ගෙවීමට සංස්ථාව බැඳී සිටී.

සංස්ථාවේ ගලපන ලද බදු පැනවිය හැකි ලාභය මත පදනම්ව ආදායම් බදු පිළිබඳ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශ තුළින් සලසා ඇත.

ii. විලම්භිත බදු පැනවීම් ගණනය කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 අනුව විලම්භිත බදු පැනවීම් හඳුනා ගැනීම් සලකා බැලීම්

ත්‍රිකුණාමලය ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් 2019 වසරේ දී විලම්භිත බදුවලට ගණනය කර නොමැති අතර ඒවා 2020 වසරේ විලම්භිත බදුවලට ඇතුළත් කර ඇත.

විලම්භිත බදු වත්කම් සහ වගකීම්

මූල්‍ය ස්ථාවරය	2020	2019	2018 ගලපන ලද	ගැලපුම	2018
විලම්භිත බදු වගකීම්	405,762,153	407,291,664	528,403,122	418,562,452	109,840,670
විලම්භිත බදු වත්කම්	(13,224,803)	(10,852,398)	(4,126,647)	4,844,001	(8,970,648)
ශුද්ධ විලම්භිත බදු වගකීම්	392,537,329	396,439,266	524,276,475	423,406,453	100,870,022
විස්තිරණ ආදායම් ප්‍රකාශය					
විලම්භිත බදු වගකීම්	(1,529,512)	(121,111,457)	449,001,602	418,562,452	30,439,150
විලම්භිත බදු වගකීම්	(2,372,405)	(6,725,751)	2,410,121	4,844,001	(2,433,880)
ශුද්ධ විලම්භිත ආදායම් බදු ආදායම (වියදම්)	(3,901,917)	(127,837,208)	451,411,723	423,406,453	28,005,270

සටහන 9

දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ, ශ්‍රී. ලං. ඉ. ස.

දළ ධාරණ ගිණුම පිරිවැය මත	2020.01.01 දිනට ශේෂය රු.	එකතු කිරීම්/ මාරුකිරීම් රු.	බැහැර කිරීම්/ මාරු කිරීම රු.	2020.12.31 දිනට ශේෂය රු.	ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන 01.01.2020	කාලය සඳහා අයකිරීම	පෙර වර්ෂයේ ගැලපුම	Provision for Depreciation 31.12.2020 Rs.	NBW As at 31.12.2020
ඉඩම	7,574,763			7,574,763					7,574,763
ගොඩනැගිලි	428,852,611	1,257,647		430,110,257	155,082,832	10,342,752	67,864	165,493,448	264,616,809
පිරියත හා යන්ත්‍රෝපකරණ	508,987,649	25,922,570		534,910,218	352,811,790	10,626,456		363,438,246	171,471,972
සංගීත උපකරණ	7,772,149			7,772,149	7,054,194	109,906		7,164,099	608,050
මෝටර් රථ	53,863,675			53,863,675	52,783,400	2,963		52,786,363	1,077,313
මූල්‍ය කල්බදු වත්කම් - මෝටර් වාහන	129,546,004	1,364,265		130,910,269	103,905,706	2,477,742		106,383,448	24,526,822
ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ	24,988,249	19,750		25,007,999	24,971,627	3,291		24,974,918	33,081
පටිගත කිරීම් සහ වෙප්පට	726,051,626	12,525,799		738,577,425	498,557,713	17,909,875		516,467,589	222,109,836
ශ්‍රව්‍ය සංඛ්‍යානය	1,284,963,472		240,000	1,284,723,472	734,235,637	34,213,828		768,449,465	516,274,008
සම්ප්‍රේෂක	120,070,603	2,095,260		122,165,863	77,104,232	37,728,751		114,832,983	7,332,880
පරිගණක උපකරණ	450,340			450,340					450,340
ලුහු මෙවලම්	163,679			163,679	143,720	8,648		152,368	11,311
	3,293,284,820	**43,185,291**	**240,000**	**3,336,230,112**	**2,006,650,851**	**113,424,213**	**67,864**	**2,120,142,927**	**1,216,087,185**

දළ ධාරණ ගිණුම පිරිවැය මත	2020.01.01 දිනට ශේෂය Rs.	එකතු කිරීම්/ මාරුකිරීම් රු.	බැහැර කිරීම්/ මාරු කිරීම් රු.	2020.12.31 දිනට ශේෂය Rs.	ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන 01.01.2020 Rs	කාලය සඳහා අයකිරීම Rs.	පෙර වර්ෂයේ ගැලපුම	Provision for Depreciation 31.12.2020 Rs.	NBW As at 31.12.2020
පිරියත සහ යන්ත්‍රෝපකරණ	179,582,058			179,582,058	107,294,490	13,468,654		120,763,144	58,818,914
මෝටර් රථ	7,544,000			7,544,000	7,430,000	800,000	(1,086,000)	7,144,000	400,000
ගෘහභාණ්ඩ, තිරවුරු	2,839,794			2,839,794	1,703,877	212,984		1,916,861	922,933
කාර්යාල උපකරණ	7,782,753			7,782,753	6,226,203	778,275		7,004,478	778,275
උත්පාදක	206,429,150			206,429,150	123,856,426	15,482,187		139,338,613	67,090,537
ශ්‍රව්‍ය සංඛ්‍යානය	53,354,383			53,354,383	31,251,083	4,001,579		35,252,662	18,101,721
සම්ප්‍රේෂක	1,521,908,873			1,521,908,873	891,395,621	114,398,165		1,005,793,786	516,115,087
පරිගණක උපකරණ	52,624,075			52,624,075	52,624,075	-		52,624,075	-
ලුහු මෙවලම්	4,632,471			4,632,471	2,779,481	347,435		3,126,917	1,505,554
පරිගණක මෘදුකාංග	159,206,556			159,206,556	95,240,615	11,940,492		107,181,107	52,025,449
උපකරණ	**2,195,904,113**			**2,195,904,112**	1,319,801,871	161,429,772	(1,086,000)	**1,480,145,643**	**715,758,469**

අස්පෘශ්‍ය වත්කම්

විස්තරය	**2020.01.01** දිනට ශේෂය රු.	එකතු කිරීම්/ මාරුකිරීම් රු.	බැහැර කිරීම්/ මාරු කිරීම් රු.	2020.12.31 දිනට ශේෂය රු.	ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන 01.01.2020 රු.	කාලය සඳහා අයකිරීම රු.	බැහැර කිරීම/මාරු කිරී	Provision for Depreciation 31.12.2020 රු.	NBW As at 31.12.2020
පරිගණක මෘදුකාංග ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය	12,124,157			12,124,157	12,124,157			12,124,157	-
මෘදුකාංග	13,658,198	830,250		14,488,448	2,913,028	8,222,609		11,135,637	3,352,811

10 සටහන

ප්‍රාග්ධන නොනිමි වැඩ

විස්තරය	2020	2019
ප්‍රාග්ධන නොනිමි වැඩ	14,877,019	17,032,793
	14,949,019	**17,032,793**

11 සටහන

සංස්ථාව සී/ස ලංකා පුවත් සමාගමේ රු. මිලියනයක් ආයෝජනය කර ඇත.

ආයෝජනය

විස්තරය	2020	2019
සී/ස ලංකා පුවත් සමාගමේ ආයෝජනය	1,000,000	**1,000,000**

12 සටහන

බඩු ලේඛණ

විස්තරය	2020	2019
පාරිභෝජන භාණ්ඩ	19,380,268	18,133,544
නැති වූ හානි වූ භාණ්ඩ	436,273	1,892,118
හුවමාරු භාණ්ඩ	1,815,739	-
	21,632,280	**20,025,662**

13 සටහන

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

විස්තරය	2020	2019
ණයගැතියන්ගේ ගුවන් කාලය	269,279,154	231,611,659
අඩු කළා: මූල්‍ය වත්කම් පිළිබඳ දෝෂ	(117,391,703)	(112,364,632)
කාර්ය මණ්ඩලය සඳහා ණය	2,809,498	4,171,986
කාර්ය මණ්ඩලය සඳහා වෙනත් අත්තිකාරම්	1,418,327	1,835,638
කාර්ය මණ්ඩල ණයගැතියෝ E.P.F.	238,952	238,952
සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ගෙවීම	97,855	1,114,536
විවිධ ණයගැතියෝ	20,508,760	20,617,238
අගරු වෙක්පත්	258,305	
ලක්හඬ සමඟ ශාඛා ගිණුම	12,807,862	12,807,862
Cash Imprest	229,583	189,920
G.S.T.Control Account	237,267	237,267
ලැබිය යුතු ආදායම (වෙනත්)	26,305,886	25,484,283
With Holding Tax (Income)	40,213,024	39,875,920
Other deposits	9,762,842	9,762,842
	266,775,612	235,583,472

සටහන 14,

මුදල් සහ මුදල් සමාන දෑ

	2020	2019
ලංකා බැංකුව - මාතර	15,000	138,015
මහජන බැංකුව ජාත්‍යන්තර ශාඛාව	154,230	184,797
ඉන්දියානු රාජ්‍ය	449,874	451,172
ලංකා බැංකුව - රජරට	15,002	15,000
ලංකා බැංකුව - මහනුවර		982,672
නේෂන් ට්‍රස්ට් බැංකුව	9,133,983	3,244,526
ලංකා බැංකුව - ටොරින්ටන් - ගුවන්විදුලි බලපත්‍ර	4,493,413	1,612,591
ලංකා බැංකුව - කැසට් අලෙවිය	114,243	-
ලංකා බැංකුව - මදුරාසිය	1,768,243	1,768,243
ලංකා බැංකුව ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය	24,924,372	31,203,239
ලංකා බැංකුව යාපනය	4,200	291,400
ලංකා බැංකුව - ඉතුරුම්	107,921	104,044
මහජන බැංකුව - ඉතුරුම්	51,498,443	75,989,614
එකතුව	**92,678,923**	**115,985,312**
අයිරා ශේෂ (ගිණුම් අංකය:265 සහ මහනුවර)	**(54,324,046)**	**(36,925,978)**
	38,354,877	**79,059,335**

15 සටහන,

රඳවාගත් ඉපැයීම්

විස්තරය	2020	2019	2018
ආරම්භක ශේෂය	**(475,784,467)**	**(374,785,389)**	**(55,470,045)**
+ ගැලපුම්		-	-
(-) ගැලපුම්	(41,975)	(127,837,208)	(276,645,232)
විස්තිරණ ආදායම	(71,945, 77)	-	-
		26,838,130	**(42,670,112)**
එකතුව	**(547,771,519)**	**(475,784,467)**	**(374,785,389)**

16 සටහන

විස්තරය	2020	2019 adjusted	Adjustment	2019 approved
උපචිත වියදම	14,652,739	14,601,069		14,601,069
සේව. අ.අ.	6,102,068	6,303,983		6,303,983
හිමිකම් නොපෑ වැටුප් හා වේතන	301,993,797	279,038,962	(3,732,908)	282,771,870
ජංගම ගිණුම කලාපීය සේවාව	4,610,966	4,232,117		4,232,117
ME ආරක්ෂක තැන්පතුව	19,521,305	12,215,702		12,215,702
සැනසුම - සුනාමි	473,325	346,800		346,800
කල්බදු ගිණුම	496,010	205,621		205,621
City & Guilt පරීක්ෂණ ගාස්තු	15,053	15,053		15,053
රජරට සංචාරක බංගලාව	180,315	384,454		384,454
	348,045,579	**317,343,760**	**(3,732,908)**	**321,076,669**

17 සටහන

විස්තරය	2020	2019
ලංකා බැංකුව - ටොරින්ටන් - ප්‍රධාන ශාඛාව	54,272,046	36,746,227
ලංකා බැංකුව - මහනුවර	52,000	
ලංකා බැංකුව - කැසට්පට අලෙවිය		179,751
	54,324,046	**36,925,978**

18 සටහන

මූල්‍ය නොවන වගකීම්

විස්තරය	2020	2019
N S L	15,007,806	15,007,806
Save the nation අරමුදල	(12,418)	(12,418)
උපයනවිට ගෙවීම් බද්ද	43,098	100,466
රඳවා ගැනීමේ බද්ද	923,051	887,295
VAT පාලන ගිණුම	39,974,854	29,407,981
ජාතිය ගොඩනැගීමේ බද්ද	52,619,337	53,569,469
ජාතික ආරක්ෂක අරමුදල	3,761,242	8,112,546
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන	2,835	2,835
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු	692,759	692,759
	104,150	60,925
	113,116,715	**107,829,664**

19 සටහන,

මූල්‍ය කල්බදු

	2020	2019
මූල්‍ය කල්බදු (මෝටර් රථ)	8,539,635	8,551,384
වර්ෂය තුළ එකතු කළ ගැලපුම්	**8,539,635**	**8,551,384**

20 සටහන,

විදේශීය ප්‍රදානය

විස්තරය	2020	2019
ත්‍රිකුණාමලය ප්‍රදානය - ඩුෂ්වෙල්	24,429,267	31,456,441
	670,834,669	826,241,343
	695,263,936	**857,697,784**

21 සටහන

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

2020 දෙසැම්බර් මස **31**වැනි දිනට

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකමේ වෙනස්වීම්

	2020	2019
වර්ෂය ආරම්භයේ දී විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	**232,428,447**	**200,322,804**
ආරම්භක ශේෂය ගැලපුම්		(2,517,832)
	232,428,447	**197,804,972**
ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගත් වියදම		
ජංගම සේවා පිරිවැය	11,879,884	9,375,532
ගැලපුම්	15,385,742	19,095,278
පොලී පිරිවැය	**27,265,626**	**28,470,811**
වෙනත් විස්තීරණ ආදායමේ හඳුනාගත් ආදායම		
ජීවගණක (ලාභය)/පාඩුව	61,720,242	56,569,495
ගැලපුම් (ලාභය)/පාඩුව		
මුළු ගෙවීම		
ගෙවූ ප්‍රතිලාභ	(39,002,138)	(50,416,830)
සැලසුම අනුව ගෙවූ ප්‍රතිලාභ		
ගැලපුම්		
	(39,002,138)	**(50,416,830)**
වගකීම්වල වර්තමාන වටිනාකම	**282,412,177**	**232,428,447**

උපකල්පන මූලධර්මය

වට්ටම් අනුපාතිකය	7.79%	11.88%
අනාගත වැටුප් වැඩිවීම්	1.50%	3%
විශ්‍රාම වයස	60 yrs	60 yrs
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය	2.00%	2%

2020 දෙසැම්බර් 31 දිනෙන්
අවසන් වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිඒඑම/ඒ/එස්එල්බීසී/1/20/577

මඟේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2021 දෙසැම්බර් 31 දින

සභාපති

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ පදනම් කරගෙන සකස්කර තිබුණද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.1 යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 40A සහ 40B ඡේදවලට අනුව මූල්‍ය ප්‍රකාශන අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කළවිට (Retrospective Restatement) ප්‍රවර්තන කාලච්ඡේදය සහ ප්‍රවර්තන කාලච්ඡේදයට පෙර කාලච්ඡේද දෙකක් සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශ තුනක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 81 A ඡේදයට අනුව වර්ෂයේ බදු පසු ලාභය හෝ අලාභය වෙන්ව දැක්වෙන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සකස්කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 26 (a) ඡේදය අනුව විශ්‍රාමික ප්‍රතිලාභ වගකීමෙහි (Retirement Benefit Obligation) ධාරණ අගය සහ එහි බදු පදනම අතර ඇතිවන තාවකාලික වෙනස්වීමෙහි (Temporary Difference) ප්‍රතිඵලය විලම්භිත බදු වත්කමක් වුවද, විගණනයට ලබා දුන් විලම්භිත බදු උපලේඛන අනුව 2019 හා 2020 වර්ෂවල අවසන් පාරිතෝෂික වගකීම මත පිළිවෙලින් රු. 65,079,965 ක් හා රු. 79,018,332 ක් ලෙස විලම්භිත බදු වගකීමක් හඳුනාගෙන තිබූ අතර මේ හේතුවෙන් අවසන් ශුද්ධ බදු වගකීම 2019 වර්ෂයේදී රු. 130,159,930 කින් හා 2020 දී රු. 158,036,664 කින් අධිතක්සේරු වී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 61A ඡේදයට අනුව වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගන්නා අයිතමයන්ට අදාළ විලම්භිත බදු අගය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ආයුගණක අලාභය රු. 61,720,242 ක් මත විලම්භිත බදු අගය වන රු. 17,281,668 ක් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම රු.282,412,178 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛණය අනුව එම වටිනාකම රු. 282,208,329 ක් වූයෙන් රු. 203,849 ක වෙනස මත හඳුනා නොගත් විලම්භිත බදු අගය රු. 57,078 ක් විය.

(උ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගුවන් කාල ණයගැනියන් සඳහා සමාලෝචිත වර්ෂයේ අඩමාන ණය වෙන්කිරීම රු.4,214,919 ක් විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.5,027,070 ක් ලෙස දක්වා තිබීම නිසා රු.812,151 කින් සමාලෝචිත වර්ෂයේ අලාභය වැඩියෙන් දක්වා තිබුණි.

(උ) පිළිවෙලින් පිරිවැය රු. 31,078,837ක් හා රු. 1,521,908,873 ක් වටිනා පරිගණක උපාංග සහ සම්ප්‍රේක්ෂණ උපකරණ සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.8,789,591ක් වැඩියෙන් ගිණුම්ගතකර නිබුණි.

(ඒ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැහැර හරිනු ලබන බදු අයකිරීමේ ඒකකයේ වාර්තා සහ සංස්ථාවේ බදු ගෙවීම් සම්බන්ධ බදු ගිණුම් අනුව 2020 දෙසැම්බර් 31 දිනට මුළු බදු වගකීම රු.204,824,632 ක් (දඩ මුදල් රහිතව) විය යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වගකීම් යටතේ එය රු.112,099,096 ක් ලෙස දක්වා තිබුණු අතර ඒ අනුව ගෙවිය යුතු හිඟ බදු වටිනාකම රු.92,725,535 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) විකාශනාගාරයන් පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබාගෙන තිබුණු රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හෙක්ටයාර 0.3194 ක් සඳහා 1995 සිට 2017 වර්ෂයට අදාල බදු කුලිය හා කුවිවවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හෙක්ටයාර 119.5309 ක් සඳහා 2017 වර්ෂයට අදාල එකතුව රු. 127,149,208 ක් බදු කුලී සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ඉඩම්, ගොඩනැගිලි , වෙළඳණයගැනියෝ. බැංකු ගිණුම් ශේෂ සහ කොටස් සහතික වල එකතු වටිනාකම රු.723,276.809 ක් තහවුරු කරගැනීම සඳහා අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්ථිකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මඟ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති,රීති, රෙගුලාසිවලට හා විධානයන්ට යොමුව	නිරීක්ෂණය
(අ) 2015 ඔක්තෝබර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ අංක PED 01/2015(i)	නිල වාහනයක් හිමි නිලධාරියෙකුට එම නිල වාහනය හෝ රු.50,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ අදාළ තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව ගත හැකි වුවද 2020 ජනවාරි 30 දින සිට මෝටර් රථයක් හිටපු සභාපතිවරයා සඳහා වෙන්කර තිබියදී. මාසික ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ලෙස රු.659,610 ක්ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.
(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛ	පැවරුම් පදනම මත සේවය ලබා ගැනීමේදී අදාළ කාර්යය ඉටු කළ පසු රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය මත ගෙවීම් සිදු කළ යුතු වුවද
(i) II කොටසෙහි 6.2 වැනි වගන්තිය	පැවරුම් නිම කිරීමට පෙර අනුමැතියකින් තොරව පැවරුම්ලාභීන් 7 ක් සඳහා 2020 වර්ෂයේ දී රු. 3,519,117 ක් ගෙවා තිබුණි.
(ii) 9.1 වගන්තියෙන් සංශෝධිත මු.රෙ. 371 (2) (ආ) සහ 371	අදාළ කාර්යය නිම කර දින 10 ක් තුළ ලබාගත් අග්‍රිමය පියවිය යුතු වුවද එකතුව රු.1,016,027 ක් වූ අතුරු අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ)	2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015 හි 3.2.1 ඡේදය හා 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2020 හි1.5 ඡේදය	මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ සහිතව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය හා භාණ්ඩාගාර ලේකම් දැනුවත් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේදී හිටපු සභාපතිවරයාට ලීටර 1011 ක අමතර ඉන්ධන අනුමැතියකින් තොරව ලබා දී තිබුණි.
(ඈ)	2014 සැප්තැම්බර් 17 දිනැති ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මාණ්ඩලික නිවේදන අංක : එස්.එල්.බී.සී/3142 හි 04 වන වගන්තිය	නිලධාරියෙකු ලබා ගත් අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරම් නොදිය යුතු වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 24 දෙනෙකුට රු.6,289,418 ක අත්තිකාරම් ලබා දී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) සංස්ථාව විසින් ලංකා පුවත් ආයතනයෙහි කොටස් මිලදී ගැනීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව 1993 වර්ෂයේදී රු.1,000,000 ක් ආයෝජනය කර තිබුණු නමුත් 2020 වර්ෂය දක්වාම කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යමණ්ඩලයට අනුව තනතුරු 35 ක පුරප්පාඩු 371 ක් හා තනතුරු 42 ක 364 ක අතිරික්තයක් පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු 102 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණ අතර අනුමත කරන ලද තනතුරු ප්‍රමාණය ඉක්මවා අවස්ථා 6 කදී බඳවාගෙන තිබුණ අතිරික්ත සේවක සංඛ්‍යාව 35ක් විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.20,508,760 ක් වූ විවිධ ණයගැති ශේෂය තුළ වසර 2 ත් 20 ත් අතර කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.6,774.855 ක ශේෂයක් පැවති අතර බාහිර ආයතනවලට නිදහස් කර තිබූ සංස්ථා සේවකයින්ට ගෙවන ලද ප්‍රතිපූර්ණය නොකරන ලද රු. 2,117,912 ක්ද මෙම ශේෂයතුළ ඇතුළත් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු 1981 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ එකතුව රු.149,420,035 ක් වර්ෂ 39 ක කාලයක සිට නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඉ) විකාශනාගාර පවත්වාගෙන යන හුන්නස්ගිරිය හා ත්‍රිකුණාමල භූමිය වෙනුවෙන් 2018, 2019 හා 2020 වර්ෂ සඳහා ගිණුම්ගත කර තිබුණු ගෙවිය යුතු බදු කුලී ලෙස රු. 31,905,000ක් පියවීමට 2021 නොවැම්බර් මස වන විටද ක්‍රියාකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති වාර්තාව සඳහා

සංස්ථාවේ පරිකථනය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සංස්ථාවේ පරිකථනය.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) විගණන නිරීක්ෂණය නිවැරදිය. 2020 මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම ගිණුම්කරණ ප්‍රමිතිය අනුව නිවැරදිව ගිණුම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි විලම්භීත බදු සම්බන්ධව පූර්ව කාලපරිච්ඡේදයට අදාල ගැළපීම් සිදුකර ඇති අතර එම ගැළපීම මත විලම්භීත බදු සම්බන්ධ ශේෂයන් 2020 ආරම්භක ශේෂය හා 2019 ආරම්භක ශේෂය හා 2018 ආරම්භක ශේෂයට කොපමණ බලපෑමක් සිදු කලේ ද යන්න සටහන් අංක 8.1 යටතේ දක්වා ඇත.

එමෙන්ම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයද 2019 හා 2018 අවසන් ශේෂයේ සිට දක්වා ඇත. ශේෂපත්‍රයද 2018 අවසන් ශේෂයේ සිට දක්වා ඇත. ඒ අනුව ප්‍රමිත අංක 1.40 ඒ සහ 40 බී ඡේදවලට අදාලව මුල්‍ය ප්‍රකාශවල ශේෂයන් හෙළදරව් කර ඇත.

(ඇ) මුල්‍ය ප්‍රකාශවල වෙනත් විස්තීරණ ආදායම් යන්න වෙනමම දක්වා නොමැත. මෙය ඉදිරි වර්ෂවල ගිණුම් සකස් කිරීමේදී දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) විශ්‍රාම ප්‍රතිලාභ වගකීමෙහි ධාරණ අගය සහ එහි බදු පදනම අතර ඇතිවන තාවකාලික වෙනස්වීමෙහි ප්‍රතිඵලය බදු වත්කමක් ලෙස සැලකූ විට ගිණුම්වල දක්වා ඇති බදු වගකීම එම ප්‍රමාණයෙන් අඩු වී බදු වත්කම එම ප්‍රමාණයෙන්ම වැඩිවේ. මේ නිසා විගණනය පෙන්වා දී ඇති පරිදි 2019, 2020 අවසන් ශුද්ධ බදු වගකීමට කිසිදු බලපෑමක් ඇති නොවේ.

(ඉ) විගණනය පෙන්වා දී ඇති කරුණු හා එකඟ වේ. ඉදිරි වර්ෂවල ගිණුම්සකස් කිරීමේදී නිවැරදි කිරීමට නියමිතය.

(ඊ) විගණනය පෙන්වා දී ඇති කරුණු හා එකඟ වේ. රු.57348.00 අවසන් ශුද්ධ බදු අගය අඩුවී ඇත.

(උ) විගණන නිරීක්ෂණය හා එකඟ වේ. 2021 වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශනවල නිවැරදි ශේෂයන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඌ) 2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස නිවැරදි කරන ලදී.

(එ) විගණන නිරීක්ෂණය නිවැරදිය. 2021 වර්ෂයේ නිවැරදි කිරීමට නියමිතය.

(ඒ) හුන්නස්ගිරිය විකාශනාගාරය සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ නිවැරදිය.

කුච්චවේලි ඉඩම සඳහා වන බදු මුදල, 2022.01.18 දිනැති අංක අමප 22/0012/316/001 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත.

(ඔ) විගණන නිරීක්ෂණය නිවැරදිය. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

2.2.2 නීති රීති රෙගුලාසිවලට හා විධානයන්ට යොමුව

(අ)	2015 ඔක්තෝබර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015 (i)	මේ සම්බන්ධ විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ	මේ සම්බන්ධ විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ.
	(ii) කොටසෙහි 6.2 වැනි වගන්තිය	
	(ii) 9.1 වගන්තියෙන් අංශෝධිත මු.රෙ.371(2) ආ සහ 371	වසර 15ක් ඉක්මවූ අත්තිකාරම් මුදල 2021 දෙසැම්බර් මස පියවීමට කටයුතු කර ඇති අතර වර්තමානයේ අත්තිකාරම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරයි.

(ඇ) විගණන නිරීක්ෂණයට එකඟ වේ. සභාපතිවරයා තම අභිමතය පරිදි කටයුතු කර ඇතත් ඔහු සංස්ථාවෙන් ඉවත් වී ඇති නිසා නිවැරදි කිරීමට හැකියාවක් නොමැත.

(ඈ) වර්තමානයේ මෙම තත්ත්වය නිවැරදි කර ඇත.

2.2.3 විගණන විමසුම හා එකඟ වේ. ඉදිරියේදී එවන් තත්ත්වයන් වලක්වාලීමට කටයුතු කිරීමට නියමිතය.

2.2.4 විගණන විමසුම හා එකඟ වේ. 2021 වර්ෂයේ සංස්ථා මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ආයතනය සතු ඌණ උපයෝජන දේපළ හා වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇත.

2.3. වෙනත් කරුණු

(අ) ලංකා පුවත් ආයතනය ආරම්භ කිරීමේදී මෙම මුදල යොදවා ඇති අතර මේ සඳහා කිසිදු ලාභාංශය ආදායමක් ලැබී නොමැති බවට විගණන නිරීක්ෂණ නිවැරදිය.

(ආ) විගණන නිරීක්ෂණ නිවැරදිය. සංස්ථා මණ්ඩල අනුමැතිය ලැබී නොමැති වීම හේතුවෙන් 2022.02.24 පැවති සංස්ථා මණ්ඩල රැස්වීමේදී තනතුරු සියල්ල අහෝසි කර ඇත.

(ඇ) සියලුම අයවිය යුතු ශේෂ ණයගැති ශේෂයන් ලෙස එම ගිණුමට ඇතුළත් වී ඇති බවට විගණන නිරීක්ෂණය නිවැරදිය.

(ඈ) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් වන විගණන නිරීක්ෂණය නිවැරදිය.

(ඉ) හුන්නස්ගිරිය සම්බන්ධ විගණන නිරීක්ෂණය නිවැරදිය.

ත්‍රිකුණාමලය (කුච්චවේලි) ඉඩම සඳහා වන බදු මුදල, 2022.01.18 දිනැති අංක අමප 22/0012/316/001 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත.



ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்

Sri Lanka Broadcasting Corporation

Printed at the State Printing Corporation